ඉහළ විශ්වාසනීයත්වයක් උදෙසා

වාර්ෂික වාර්තාව 2021



SLASAB

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මඟින් සංස්ථාපනය කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඉදිරිපත් කිරීමේදී හා විගණනය කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ.
(63 පිටුව බලන්න)

පටුන

මණ්ඩලයේ සාමාජිකයින්....01

2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සාමාජිකයින්....02

2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ නිරීක්ෂකයින්/ආරාධිතයින්....06

2021 තුළ දී මණ්ඩලය පත්කල කමිටු සහ උප කමිටු 07

2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කාර්ය මණ්ඩලය.... 08

තාක්ෂණික කාර්ය මණ්ඩලය.... 09

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021....10

2021 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම් 20

2021 වර්ෂයේදී ලබාගත් එකඟතාවයන්.... 25

2021 තුළදී විගණන පරීක්ෂණ.... 26

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි කාර්යය සාධනය වැඩි දියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන හා මධ්‍ය කාලීන පියවර.... 30

කාර්යය සාධන ලකුණු පත.... 32

2021 දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලතාවය දක්වන ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන්ගේ (SBE's) මූල්‍ය ප්‍රකාශන.... 34

2021 වර්ෂයේදී සමාලෝචනය කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලතාවය දක්වන ලද, නිරීක්ෂණ සහිත බැවින් උපකාරක ලිපි මඟින් දැනුම්දෙන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්ගේ (SBE's) මූල්‍ය ප්‍රකාශන.... 39

2021 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන ලද ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය අංශයේ අස්ථිත්වයන්.... 43

2021 වර්ෂය තුලදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සිදුකරන ලද ප්‍රමිත සකස් කිරීම හා බැඳුනු ක්‍රියාකාරකම්.... 44

විගණකාධිපති වාර්තාව.... 46

2021 විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්වය 50

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 52

මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය 53

ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 54

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 55

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 56

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 63

වාර්ෂික වාර්තාව - 2021

මණ්ඩලයේ සාමාජිකයන්

කේ එම් ඒ එන් දවුලාගල මිය *FCMA (UK), MBA (USJP) MSc (Fin. and Busi. Econ, (UK)* සහකාර අධිපති - ශ්‍රී ලංකා මහ බැංකුව	සභාපතිනිය (2021 දෙසැම්බර් 30 දින දක්වා)	
ඩී එන් ආර් සිරිවර්ධන *B.A (Hons), LLB , LLM, නීතීඥ* සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්	නිල බලයෙන් සාමාජික (2021 ජනවාරි 2 දින දක්වා)	
එස් දිසානායක *LLM, නීතීඥ* සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්	(2021 ජූලි 8 දින සිට)	
එච් එම් ඩබ් සී බණ්ඩාර *B.Com (Sp.), LLB, නීතීඥ* කොමසාරිස් ජනරාල් - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	නිල බලයෙන් සාමාජික	
සී මෙන්ඩිස් *නීතීඥ* අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව	නිල බලයෙන් සාමාජික	
ඩබ් ඩබ් ජේ සී පෙරේරා *FCA, FCMA, B.Sc (B.Admin), CFE* හවුල්කරු, කේ පී එම් ජී	පත්කල සාමාජික	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
එච් එම් ඒ ජයසිංහ *FCA, FCMA, CIPFA* හිටපු සභාපති - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, දේශීය කළමණාකරණ හවුල්කරු, අර්නස්ට් සහ යංග්, ශ්‍රී ලංකාව සහ මාලදිවයින	පත්කල සාමාජික	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
එස් එම් එස් එස් බණ්ඩාර *FCA, MBA (Col.) B.Sc Acc. and Fin. Management (USJP)* සභාපති - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, හවුල්කරු, බී. ආර් ද සිල්වා සහ සමාගම	පත්කල සාමාජික	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
පී ආර් ඒ අයි ගුණරත්න *ACMA (UK), CGMA, ACCA Affiliate, Dip.in Banking and Fin., B.Sc. Eng. (Hons), MBA (UK)* මූල්‍ය ප්‍රධානි - රිසස් චිනර්ජි පොදු සමාගම	පත්කල සාමාජික	චික්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා අංශය
ආර් ටී අමරසූරිය *LLB (Hons.) (Col.), FCMA (UK), FCMA (SL), CGMA නීතීඥ* හිටපු ලේකම් - ශ්‍රී ලංකා නීතීඥ සංගමය ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ හිටපු කොමිෂන් සාමාජික	පත්කල සාමාජික	ශ්‍රී ලංකා නීතීඥ සංගමය
පී ඩී සමරසිංහ *FCA, FCMA (UK), MBA* සමූහ අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිළධාරී - ඕවර්සීස් රියැලිටි (සිලෝන්) පොදු සමාගම	පත්කල සාමාජික (2022 ජනවාරි 31 දින දක්වා)	ලංකා වාණිජ මණ්ඩලය
කේ කේ එස් ගුණවර්ධන *BA (Hons.) Econ. Sp., Dip.in Hypermedia Eng.(Col.), Dip.in Multimedia Technology (Col.), PGDip in Busi. and Fin. - ICA (SL)* කළමණාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරී - ග්‍රැෆික් සිස්ටම්ස් (පෞද්) සමාගම	පත්කල සාමාජික	ශ්‍රී ලංකා කර්මාන්ත හා වාණිජ මණ්ඩල සම්මේලනය
ඒ ගුණසේකර *FCA, FCMA, MBA (USJP)* ජ්‍යෙෂ්ඨ උප සභාපති, සංකලනිත අවදානම් කළමණාකරණ/ ප්‍රධාන අවදානම් නිළධාරී - ඩී.එෆ්.සී.සී. බැංකුව	පත්කල සාමාජික (2021 දෙසැම්බර් 31 දින දක්වා)	ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය
මහාචාර්ය ඒ ජයමහ *PhD (USQ-Aus), M.Com (UoK), B.Com (UoK), FCA* පීඨාධිපති - පශ්චාත් උපාධි පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය	පත්කල සාමාජික	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
එම් ඩී පී එල් පෙරේරා මිය *FCA, MBA*		මණ්ඩලයේ ලේකම්

මණ්ඩලයේ සාමාජිකයන්

2021 දෙසැම්බර් 31 දිනට



කේ එම් ඒ එන් දවුලාගල මිය
FCMA (UK), MBA (USJP)
MSc (Financial and Business Economics), University of Essex

මණ්ඩලයේ සභාපතිනිය වන දවුලාගල මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරියකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ෂ 31 කට වැඩි කාලයක් සේවය කරන දවුලාගල මිය මූල්‍ය, විගණන, සංචිත කළමණාකරණය, නියාමනය සහ සුපරීක්ෂණය, සාර්ව විකෂණ සෝදිසි කිරීම්, මානව සම්පත් කළමණාකරණය සහ අවදානම් කළමණාකරණය යන ක්ෂේත්‍රවල නියැලීමෙන් මනා පලපුරුද්දක් ලබා තිබේ.



එස් දිසානායක
LLB, නීතීඥ

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වන දිසානායක මහතා ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්ත නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙකු වන අතර ඔහු දැනට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස වැඩ භාර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) විසින් නිදහස් කර ඇත.

දිසානායක මහතාට නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ සහ සිවිල් යන අංශ දෙකෙහිම පළපුරුද්ද ඇති අතර 2010 පෙබරවාරි සිට 2011 ජූලි දක්වා දූෂණයට එරෙහි ෆීපී ස්වාධීන කොමිසමේ අභිචෝදකයෙකු ලෙස සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ,ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිලබලයෙන් පත්වූ සාමාජිකයෙකි.



එච් එම් ඩබ්ලිව් සී බණ්ඩාර
B.Com (SP), LLB, නීතීඥ

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වන බණ්ඩාර මහතා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වර්ෂ 34 කට අධික කාලයක් සේවය කර ඇත. ඔහු දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමණාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කර ඇති අතර, එහි මූලික කණ්ඩායම් සාමාජිකයෙක් ද වේ. බණ්ඩාර මහතා ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීන්ගේ සංගමයේ සාමාජිකත්වය දරනු ලැබේ.



සී. මෙන්ඩිස්
නීතීඥ

මෙන්ඩිස් මහතා ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

මණ්ඩලයේ සාමාජිකයන්

2021 දෙසැම්බර් 31 දිනට



ඩබ් ඩබ් ජේ සී පෙරේරා
FCA, FCMA, B.Sc (B.Admin), CFE

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයකු වන පෙරේරා මහතා ශ්‍රී ලංකාවේ කේපීඑම්ජී ආයතනයේ හවුල්කරුවකු වේ. ඔහු කේපීඑම්ජී ආයතනයේ අවදානම් උපදේශන සහ වෝහාරික සේවා අංශයේ ප්‍රධානියා වේ.

ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ සහතිකලත් වංචා විමර්ශකයින්ගේ සංගමය පිලිගත් සහතිකලත් වංචා විමර්ශකයකු සහ ඇමරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද වේ.



එච් එම් ඒ ජයසිංහ
FCA, FCMA, CIPFA

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයා වන ජයසිංහ මහතා ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ දේශීය කළමණාකරණ හවුල්කරුවකු වේ. ඔහු අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ බැංකුකරණ සහ මූල්‍ය සේවා පරිච භාර සහතික කිරීමේ ප්‍රධානියා ද වේ.

ජයසිංහ මහතා ගිණුම්කරණය සහ විගණනය පිළිබඳව අවුරුදු 39 කට අධික කාලයක පුළුල් පළපුරුද්දක් ලබාගෙන ඇති අතර, දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (SAFA) ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපතිවරයා වශයෙන් ද කටයුතු කරයි. ඔහු වෙනත් ව්‍යවස්ථාපිත ආයතන, වෘත්තීය සංගම් සහ අධ්‍යාපන ආයතන බොහොමයක සාමාජිකයෙකු වශයෙන් ද සේවය කරයි. ලැයිස්තුගත සමාගම් කිහිපයක විගණන කමිටුවලට උපදේශකවරයෙකු ලෙස ද ඔහු සේවය කරයි.



එස් එම් එස් එස් බණ්ඩාර
FCA, MBA (Colombo) B.Sc Accountancy and Financial Management (USJP)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපතිවරයා වන බණ්ඩාර මහතා වරලත් ගණකාධිකාරීන් වන බී ආර් ද සිල්වා සහ සමාගමේ හවුල්කරුවකු වන අතර සහතික කිරීමේ සේවා සහ මූල්‍ය වාර්තාකරණය පිලිබඳ විශේෂත්වය ලබමින් පරිචයෙහි වසර 24 කට වඩා වැඩි පළපුරුද්දක් ලබාගෙන ඇත.

ඔහු ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) සහ දකුණු ආසියා ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) මණ්ඩල සාමාජිකයකු ලෙසද කටයුතු කරයි. තවද, ඔහු කැලණිය විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු වේ.



පී ආර් ඒ අයි ගුණරත්න
ACMA (UK,) CGMA, ACCA Affiliate, Dip. in Banking and Finance, B.Sc. Eng. (Hons), MBA (UK)

රිසස් චිනර්පි පොදු සමාගමේ මූල්‍ය ප්‍රධානි වන ගුණරත්න මහතා මූල්‍ය සහ ගණකාධිකරණ ක්ෂේත්‍ර වල වසර 11 කට වඩා වැඩි පළපුරුද්දක් ලබාගෙන ඇත.

අතීතයේ දී, ඔහු බ්‍රැන්ඩික්ස් සමාගම් සමූහයේ සහ කේපීඑම්ජී ආයතනයේ සේවය කොට ඇත. ඔහු ජාත්‍යන්තර සහතිකලත් වෘත්තීය ගණකාධිකාරීන්ගේ සංගමයේ මැදපෙරදිග, දකුණු ආසියා සහ උතුරු අප්‍රිකා ප්‍රාදේශීය උපදේශක මඩුල්ලේ සාමාජිකයකු වන අතර, සීඅයිඑම්ඒ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්යවරයෙක් වේ. ඔහු ශ්‍රී ලංකාව, බුරුමය, වියට්නාමය, නයිජීරියාව සහ ආසියා ශාන්තිකර කලාපය ඇතුළුව විවිධ භූගෝලීය කලාපවල සීඅයිඑම්ඒ ආයතනයේ දේශන පවත්වා ඇත.

මණ්ඩලයේ සාමාජිකයන්

2021 දෙසැම්බර් 31 දිනට



ආර් ටී අමරසූරිය
LLB (Hons.) (Colombo), FCMA (UK), FCMA (SL), CGMA,
නීතීඥ

අමරසූරිය මහතා අභියාචන නීතියේ සියළුම පැතිවල මෙන්ම ව්‍යවස්ථාපිත සහ පොදු නීතිය පිළිබඳ විශේෂත්වය ලබමින් ශ්‍රී ලංකාවේ අභියාචන අධිකරණවල නිත්‍ය වෘත්තියෙහි නියැලෙන්නෙකු වන අතර සිවිල්, ගිවිසුම්, වාණිජ, දේපල, බදු, බැංකු, කම්කරු ඇතුලත් විවිධාංගිකරණය වූ ක්ෂේත්‍ර සහ විෂයයන්වල සහ අනෙකුත් නීති ශික්ෂණයන්හි ද පරිචයක් ඇත.

2013 වසරේ වරලත් කළමණාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය (CIMA) මගින් පිරිනමන ලද වසර 40ට පහල ශ්‍රී ලංකාවේ වාඩාත් කැපීපෙනෙන සාමාජික ලෙස CIMA තරු රන් සම්මානයෙන් පිදුම් ලබා තිබේ.

ඔහු ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ ආසන්නතම හිටපු ලේකම්, කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීගේ සංගමයේ සභාපති, ශ්‍රී ලංකා සංස්ථාපිත නීති අධ්‍යාපන මණ්ඩලයේ සාමාජික, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති අධ්‍යාපන ස්ථාවර කමිටුවේ සාමාජික, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ නීති පීඨයේ උපදේශක මණ්ඩලයේ සාමාජික සහ ශ්‍රී ලංකා ජාතික බේරුම් කිරීම් මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ සාමාජික ලෙස සේවය කරයි. ආසියා ශාන්තිකර නීති සංගමයේ විධායක කමිටු සාමාජික ලෙස ද ඔහු සේවය කරයි.

තවද ඔහු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) හිටපු කොමිෂන් සාමාජිකයෙකු වේ.



පී ඩී සමරසිංහ
FCA, FCMA (UK), MBA

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ දේපල සමාගමක් වන ඕවර්සීස් රියැලිටි (සිලෝන්) පොදු සමාගමේ සමූහ අධ්‍යක්ෂක/ ප්‍රධාන විධායක නිළධාරී වන සමරසිංහ මහතා නිෂ්පාදන, වැවිලි සහ මූර්ත දේපල යන ක්ෂෙත්‍රවල වසර 31 කට වඩා වැඩි පළපුරුද්දක් ලබාගෙන ඇත. ඔහු ප්‍රසිද්ධ ලයිස්තුගත සහ ලයිස්තුගත නොවන සමාගම් කිහිපයක මණ්ඩලවල සහ මණ්ඩල උප කමිටුවල සාමාජික ලෙසද සේවය කරයි.

සමරසිංහ මහතා, ශ්‍රී ලංකා අධ්‍යක්ෂකවරුන්ගේ ආයතනය, ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය, ශ්‍රී ලංකා කර්මාන්ත සංගමය සහ ශ්‍රී ලංකා ස්වාධිපත්‍ය සංවර්ධකයන්ගේ සංගමය වැනි බොහෝ සංවිධානවල හිටපු සභාපතිවරයා වේ. ඔහු චික්සත් රාජධානියේ වරලත් කළමණාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ශ්‍රී ලංකා අංශයේ) හිටපු සභාපතිවරයකු වන අතර වරලත් කළමණාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (චික්සත් රාජධානිය) හිටපු පාලක මණ්ඩල සාමාජිකයෙකි. තවදුරටත්, ඔහු ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු මණ්ඩල සාමාජිකයෙකි.

මණ්ඩලයේ සාමාජිකයන්

2021 දෙසැම්බර් 31 දිනට



කේ කේ එස් ගුණවර්ධන
BA (Hons.) Economics Sp., Dip.in Hypermedia Engineering (Colombo), Dip.in Multimedia Technology (Colombo), PGDip in Busi. and Fin. - ICA (SL)

ග්‍රැෆික් සිස්ටම්ස් (පෞද්) සමාගමේ සභාපති/ කළමණාකාර අධ්‍යක්ෂක වන ගුණවර්ධන මහතාට මුද්‍රණ කර්මාන්තය, තොරතුරු තාක්ෂණය, ගණකාධිකරණ සහ මූල්‍ය යන ක්ෂෙත්‍රවල වසර 36 කට වඩා වැඩි පළපුරුද්දක් ඇත.

දැනට ගුණවර්ධන මහතා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ තොරතුරු සහ ප්‍රවර්ධන උපදේශන කමිටුවේ සභාපතිවරයා වේ. ඔහු ශ්‍රී ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ උප සභාපතිවරයා ද වන අතර තවත් බොහෝ සමාගම් සහ සංගම්වල මණ්ඩල වල සේවය කරයි. ගුණවර්ධන මහතා 1999 සහ 2001 වර්ෂ වල ශ්‍රී ලංකා ව්‍යවසායකයා සම්මානය ඇතුළුව බොහෝ සම්මාන ලබා තිබේ.



අශෝක් ගුණසේකර
FCA, FCMA, MBA (USJP)

ඩී එෆ් සී සී බැංකුවේ ජ්‍යෙෂ්ඨ උප සභාපති, සංකලනිත අවදානම් කළමණාකරණ ප්‍රධාන අවදානම් නිළධාරී වන ගුණසේකර මහතාට බැංකු කර්මාන්තයේ මූල්‍ය කළමනාකරණ, මූල්‍ය මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණ යන ක්ෂෙත්‍රවල වසර 37 කට වඩා වැඩි පළපුරුද්දක් ඇත.

ඔහු හැටන් නැෂනල් බැංකුව පොදු සමාගමේ ප්‍රධාන මූල්‍ය නිළධාරී සහ ඩී එෆ් සී සී බැංකු පොදු සමාගමේ ජ්‍යෙෂ්ඨ උප සභාපති/ ප්‍රධාන මූල්‍ය නිළධාරී ලෙස කලින් සේවය කර ඇත.

ඔහු ඩී එෆ් සී සී සමාගම් සමූහයේ සමාගම් කිහිපයක මණ්ඩල වල සහ මණ්ඩල උප කමිටු වල ද සේවය කරයි.



මහාචාර්ය ඒ ජයමහ
PhD (USQ-Aus), M.Com (UoK), B.Com (UoK), FCA

කැලණිය විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ අධ්‍යයනාංශයේ ගණකාධිකරණය පිලිබඳ මහාචාර්යවරයා වන මහාචාර්ය ජයමහ, කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති ද වේ.

ඔහුට කැලණිය විශ්ව විද්‍යාලයේ වසර 39 කට වඩා වැඩි සේවයක් ඇති අතර ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ සහ කළමනාකරණ අධ්‍යයන පීඨයේ සහ මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන පීඨයේ, ගණකාධිකරණ අධ්‍යයනාංශ ප්‍රධානි ලෙස ද, ව්‍යාපාර අධ්‍යයන ශාස්ත්‍රපති වැඩසටහනේ සම්බන්ධීකාරක ලෙස ද සේවයකොට ඇත.

ඔහුට දර්ශනපති ආචාර්ය උපාධිය 2010 දී පිරිනැමිනි. ඔහු පරිචයෙහි නියුක්ත වන අතර, ජයමහ පුෂ්පකුමාර සහ සමාගමේ ප්‍රධාන හවුල්කරු ද වේ. ඔහු ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් කරගෙන යන ලද ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන පිලිබඳ ආයතන විමර්ෂණයේ විමර්ෂකයෙකු ලෙස සේවය සපයන ලද අතර 2020 සිට එච් ඩී එෆ් සී බැංකුවේ අධ්‍යක්ෂකවරයෙක් ලෙසත් සේවය කරයි.

මණ්ඩලයට නිරීක්ෂකයින් / ආරාධිතයින්

2021 දෙසැම්බර් 31 දිනට

සභාපති,
ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිත කමිටුව



ටී ජේ එස් රාජකාරිය
FCA, FCCA, FCMA, CGMA

රාජකාරිය මහතා කේපීඑම්පී විගණන සමාගමේ හවුල්කරුවෙකු වන අතර පොදු ගිණුම්කරණ පරිචයෙ හි වර්ෂ 36 කට අධික කාලයක් සේවයේ යෙදී සිටියි. ඔහු වර්තමානයේ කේපීඑම්පී ආයතනයේ විගණන ප්‍රධානියා ලෙස කටයුතු කරයි. කේපීඑම්පී ආයතනයේ ඔහු මැද පෙරදිග සහ දකුණු ආසියානු කලාපයේ මූල්‍ය සේවා ප්‍රධානියා වූ අතර ශ්‍රී ලංකාවේ කේ පී එම් පී ආයතනයේ මූල්‍ය සේවා අංශ ප්‍රධානියා ලෙස දිගටම කටයුතු කරයි.

ඔහුට ඕමාන්, ඩුබායි, මාලදිවයින් සහ ලන්ඩන් ආදී විදේශ රටවල සේවා පලපුරුද්දක් තිබේ. ඔහු 2018 - 2020 කාලයේ දී ACCA ශ්‍රී ලංකා අංශයේ සභාපතිවරයා ලෙස සේවය කර ඇත.

රාජකාරිය මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිත කමිටුවේ සභාපති වශයෙන් සේවය කරයි. තවද ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ කමිටු සහ පීඨ කිහිපියක සේවය කරමින් ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ දී සහ මගපෙන්වීම ලබාදීමේ දී ක්‍රියාකාරීව සහභාගි වී ඇත.

මණ්ඩලයේ නිරීක්ෂක,
භාණ්ඩාගාර නියෝජිත



කේ එස් දයාරත්න
B.Sc. (Bus. Admin), MA, ACA

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා වන දයාරත්න මිය, රාජ්‍ය අංශයේ වසර 17 කට අධික කාලයක පළපුරුද්දක් ලබා තිබේ.

ඇය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පාලක මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස සේවය කරයි.

අධ්‍යක්ෂ ජනරාල්



ඒ අයි මොහොට්ටි
FCA, FCMA (UK), CGMA, BBA (Hons.), MBA (Leicester)

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම) අධ්‍යක්ෂ ජනරාල්වරිය වන මොහොට්ටි මිය නියාමන හා වාණිජ ක්ෂේත්‍රවල නියැලී, මූල්‍ය සහ ව්‍යාපාර කළමනාකරණය සහ විවිධාකාර ව්‍යාපාර අංශවල විගණන කටයුතු වල වසර 31 කට අධික කාලයක පළපුරුද්දක් ලබා ඇත.

එම කාලයෙන් වසර 21 කට අධික කාලයක් ඇය ගිණුම් හා විගණන ප්‍රමිතවලට අනුකූලතාව දැක්වීම සම්බන්ධ නියාමන කටයුතුවල නිරත වී ඇත.

2021 තුළ දී මණ්ඩලය පත්කල කමිටු සහ උප-කමිටු

විගණන කමිටුව

එස් එම් එස් එස් බණ්ඩාර මයා	-	සභාපති
මහාචාර්ය ඒ ජයමහ	-	සාමාජික
කේ එස් දයාරත්න මිය	-	සාමාජික

පාරිශ්‍රමික කමිටුව

කේ එම් ඒ එන් දවුලාගල මිය	-	සභාපතිනි
පී ඩී සමරසිංහ මයා	-	සාමාජික
පී ආර් ඒ අයි ගුණරත්න මයා	-	සාමාජික
ආර් ටී අමරසූරිය මයා	-	සාමාජික
කේ එස් දයාරත්න මිය	-	සාමාජික

තාක්ෂණ උප -කමිටුව

ඒ ගුණසේකර මයා	-	සභාපති
එච් එම් ඒ ජයසිංහ මයා	-	සාමාජික
මහාචාර්ය ඒ ජයමහ	-	සාමාජික
පී ඩී සමරසිංහ මයා	-	සාමාජික
සී මෙන්ඩිස් මයා	-	සාමාජික

තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව

පී ආර් ඒ අයි ගුණරත්න මයා	-	සාමාජික
ඩබ් ඩබ් ජේ සී පෙරේරා මයා	-	සාමාජික
ඩී එන් ආර් සිරිවර්ධන මයා	-	සාමාජික (2021 ජනවාරි 2 දක්වා)
එස් දිසානායක මයා	-	සාමාජික (2021 ජූලි 8 දින සිට)
කේ කේ එස් ගුණවර්ධන මයා	-	සාමාජික
ඒ අයි මොහොට්ටි මිය	-	සාමාජික

ගැටුම් විසඳීමේ කමිටුව

සී මෙන්ඩිස් මයා	-	සභාපති
ආර් ටී අමරසූරිය මයා	-	සාමාජික
ඩී එන් ආර් සිරිවර්ධන මයා	-	සාමාජික (2021 ජනවාරි 02 දක්වා)
එච් එම් ඩබ්ලිව් සී බණ්ඩාර මයා	-	සාමාජික
ඒ ගුණසේකර මයා	-	සාමාජික

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය - 2021 දෙසැම්බර් 31 දිනට





01. කේ සිවකුමාර්
02. ආශා අහමත් මිය
03. අනූෂා අයි මොහොට්ටි මිය
04. මොනිටා එන් බණ්ඩාර මිය
05. හන්සා බී රසාක් මිය
06. ඉමල්කා ඉද්දමල්ගොඩ මිය
07. දුමින්දා කේ ගුරුවත්ත මිය
08. ආර් ඒ් නදීශානි මනෝදිකා මිය
09. එච් එස් යු පී ජයවර්ධන
10. ඩී එම් නිලන්ති පී දන්දෙනි මිය
11. එෆ් ශිරෝමි අබේකෝන් මිය
12. කේ රසික එස් බන්ඩාර
13. දිලිනිකා මෙන්මෙන්දඇාරච්චි මිය
14. කලණි හෙට්ටිආරච්චි මිය
15. එම් ලක්මාලි හේවගේ මිය
16. එල් වත්සලා මල්ලවාරච්චි මිය

තාක්ෂණික කාර්ය මණ්ඩලය

(2021 දෙසැම්බර් 31 දිනට)

අනූෂා අයි මොහොට්ටි මිය
FCA, FCMA (UK), CGMA, BBA (Hons.), MBA (Leicester)
අධ්‍යක්ෂ ජනරාල්

ආශා අහමත් මිය
FCA, MBA (Col)
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

මොනිටා එන් බණ්ඩාර මිය
FCA, ACA (E&W), BB Mgt (Acc) Sp
අධ්‍යක්ෂ තාක්ෂණික

හෆ්සා බී රසාක් මිය
FCA, ACMA (UK), CGMA, MBA (Sri.J)
අධ්‍යක්ෂ තාක්ෂණික

එම් ලක්මාලි හේවගේ මිය
FCA, ACMA (UK), CGMA, MBA (Sri. J)
අධ්‍යක්ෂ තාක්ෂණික

ඉමල්කා ඉද්දමල්ගොඩ මිය
ACA, B.Sc (Fin) Sp
අධ්‍යක්ෂ තාක්ෂණික

දිලිනිකා මෙන්මෙන්දආරච්චි මිය
FCA, B.Sc (Acc) Sp (Hons.)
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

කලණී හෙට්ටිආරච්චි මිය
FCA, B.Sc (Acc) Sp (Hons.)
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

ඩී එම් නිලන්ති පී. දන්දෙනි මිය
FCA, BBA (Acc) Sp (Hons.), AIB (SL)
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

එල් වත්සලා මල්ලවාරච්චි මිය
FCA, B.Sc (Acc) Sp (Hons.)
සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021

1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී. ල.ගි.වි.ප්‍ර.ස.ම.) 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත යටතේ නියාමන ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලද අතර එහි ක්‍රියාකාරී මෙහෙයුම් 2000 වර්ෂයේදී ආරම්භ විය. පනත මගින් ඇතැම් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස නිර්වචනය කරනු ලබන අතර (නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ නිර්වචනය සඳහා 63 පිටුව) බලන්න එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායය සිය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. මෙම නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායකයන් වල විගණන කටයුතු සිදු කරන විට ඔවුන්ගේ විගණකවරුන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූල වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට හැකිවන පරිදි එකී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් ඔවුන්ගේ වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. වෙත ඉදිරිපත් කළ යුතු බවට පනත මගින් නියම කර තිබේ.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් ලැබුණු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන්හි විගණන කටයුතු පිළිබඳ පරීක්ෂා කිරීම, ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු නොකිරීම පිළිබඳ විමර්ශන පැවැත්වීම සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ ඔවුන්ගේ විගණකවරුන් විසින් ප්‍රමිතීන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් සුදුසු නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම මගින් සිය කාර්යයන් ඉටු කරනු ලබයි. පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාශයට පත් කිරීම හෝ සම්මත කිරීම සිදු කරනු ලැබේ. එවැනි ප්‍රමිතීන් සම්මත කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ සහාය වීම සඳහා පනත යටතේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුවක් සහ විගණන ප්‍රමිති කමිටුවක් ස්ථාපිත කර ඇත. ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (IASB) විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති (IAS) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) මත පදනම්ව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරනු ලබයි. එසේම අනුගමනය කරන ලද විගණන ප්‍රමිතීන් ජාත්‍යන්තර විගණන සහ තහවුරු කිරීමේ ප්‍රමිති මණ්ඩලය (IAASB) විසින් සකස් කරන ලද ජාත්‍යන්තර විගණන ප්‍රමිති මත පදනම් වේ. මේ වනවිට වරලත් ගණකාධිකාරී ආයතනය විසින් එකී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් සහ ඔවුන්ගේ විගණකවරුන් විසින් අනුගමනය කළ යුතු ගිණුම්කරණ ප්‍රමිති 42 ක් සහ විගණන ප්‍රමිති 38 ක් පමණ සම්මත කර ඇත.

2. නියාමන ක්‍රියාකාරකම් සඳහා කොවිඩ් 19 පාලන පියවර මගින් ඇතිවූ බලපෑම

සෞඛ්‍ය බලධාරීන් විසින් පනවන ලද කොවිඩ් 19 වසංගත පාලන ක්‍රියාමාර්ග හේතුවෙන් ඇති වූ තොරතුරු ප්‍රවාහයේ සීමා කිරීම් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණන කටයුතු සම්පූර්ණ කිරීමේ දී විගණකවරුන් විසින් මුහුණ දුන් අභියෝග 2021 වසර තුළදී ද අඛණ්ඩව පැවතුනි. ඒ අනුව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් පවතින තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් උපරිම ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් සිය අවධානය අඛණ්ඩව යොමුකරන ලදී. තවද එහි ප්‍රතිඵලයක් ලෙස නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හි මූල්‍ය ප්‍රකාශවල විද්‍යුත් පිටපත් හැකිතාක් ලබා ගැනීම සහ මාර්ගගත ක්‍රමවේද හරහා විගණන පරීක්ෂණ පැවැත්වීම හෝ භෞතික ලිපිගොනු සම්බන්ධයෙන් විගණන කණ්ඩායමක් භෞතිකව නොමැතිව විගණන පරීක්ෂා කටයුතු කිරීම සිදු විය. කෙසේ වෙතත්, එවැනි සියලු ක්‍රියාවලීන් විසින් අවසන් නිගමනවලට එළඹීමට පෙර හඳුනාගත් ගැටළු වලට ප්‍රතිචාර දැක්වීමට නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ට හෝ විගණකවරයාට අවස්ථාව සලසා දෙයි. එමෙන්ම, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් සහ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම කාර්ය මණ්ඩල නිවසේ සිට රාජකාරී ඉටුකිරීම හේතුවෙන් සහ ඇතැම් විගණන ආයතන සහ කාර්ය මණ්ඩල විසින් මුහුණ දෙන ප්‍රවේශ සීමාවන් හේතුවෙන්, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගෙන් සහ/හෝ විගණකවරුන්ගෙන් අමතර තොරතුරු ලබා ගැනීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ප්‍රායෝගිකව හැකිතාක් දුරට විද්‍යුත් මාධ්‍ය භාවිතා කළේය.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, වාර්තා කරා ප්‍රවේශ වීම, ලිපි සකස් කිරීම, තාක්ෂණික සාකච්ඡා පැවැත්වීම, වාර්තා යාවත්කාලීන කිරීම,විගණන පරීක්ෂණ පැවැත්වීම සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සමඟ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් විද්‍යුත් මාධ්‍යයක් හරහා කාර්ය මණ්ඩලය සමාලෝචන කටයුතු කරා ප්‍රවේශ වීමත් සමඟ මෙම නව අවස්ථා වලින් උපරිම ඵල ලබා ගන්නා ලදී.

කෙසේ වෙතත්, විශාල ප්‍රමාණයක් පවතින මූල්‍ය ප්‍රකාශන වෙත ප්‍රවේශ වීම සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන්ගෙන් අමතර තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් පවත්නා සීමාවන් හේතුවෙන්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් මූල්‍ය ප්‍රකාශන ආවරණය සැලසුම් කර ඇති පරිදි පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. මෙය මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සහ විගණන පරීක්ෂා කිරීමේ විශේෂ අවස්ථා පිළිබඳ වගන්ති යටතේ විස්තර කර ඇත.

එමෙන්ම, සෑම විටම කාර්ය මණ්ඩලයේ සහ පාර්ශවකරුවන්ගේ ආරක්ෂාව සහතික කරමින් තාක්ෂණික දියුණුවේ උපරිම ප්‍රයෝජන ලබාගනිමින් කාර්ය මණ්ඩලයේ ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම් ද මාර්ගස්ථ සැසි හරහා පවත්වන ලදී.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් එහි ව්‍යවස්ථාපිත කාර්යයන් සිදු කිරීම සඳහා වසර තුළ ඉටු කරන ලද ප්‍රධාන

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021

මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

3. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

3.1 සමාලෝචනය සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවන බවට වගබලා ගැනීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හඳුනාගැනීම, මැනීම සහ ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීමේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරයි. ප්‍රමිතීන්ට අනුකූල නොවීම අනාවරණය වූ විට, අනුකූල නොවීමෙහි පවතින ප්‍රමාණවත් බව මත පදනම්ව කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රමිතීන්ට ප්‍රමාණාත්මකව අනුකූල නොවීම සම්බන්ධව අවධානය යොමු කිරීමට තරම් හේතුවක් නිරීක්ෂණය නොවුවහොත්, එම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ලෙස සලකනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක නමුත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිතා කිරීමට තරම් අවශ්‍ය නොවන ගැටලූ හඳුනාගෙන ඇති විට, එම මූල්‍ය ප්‍රකාශන නිරීක්ෂණවලට අනුකූල යැයි සලකනු ලබන අතර අනාගතයේදී ඒවායේ අනුකූලතාව වැඩි දියුණු කිරීම සඳහා ආධාර, ලිපියක්, ආකාරයෙන් අදාළ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් වෙත දැනුම් දෙනු ලැබේ. ප්‍රමිතීන්ගෙන් බැහැරවීම් මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය ප්‍රමාණාත්මකව වෙනස් කරන විට, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් නිකුත් කිරීමට නියමිත මීළඟ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන ලෙස එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් ඉල්ලා සිටී. මෙම ක්‍රියාවලියේදී, වැඩිදියුණුවීම් පිළිබඳ කාරණා දක්නට නොමැතිව අනුකූල නොවීම නැවත නැවත සිදුවන ස්වභාවයක් ඇති විට, අනාගතයේදී මූල්‍ය වාර්තාකරණය වැඩිදියුණු කිරීම සඳහා එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත අනතුරු ඇඟවීමක් නිකුත් කරනු ලැබේ.

බැහැරවීම් ව්‍යවස්ථාවේ විධිවිධානවලට පටහැනි වන නමුත්, එම උල්ලංඝනය කිරීම බරපතල ස්වභාවයක් නොමැති විට, මණ්ඩලය විසින් නියෝගයක් නිකුත් කරනු ලැබේ. කෙසේ වෙතත්, එවැනි බැහැරවීම් මූල්‍ය ප්‍රකාශන නොමඟ යවන සුළු තත්ත්වයක් බවට පත්කරන විට, ව්‍යවස්ථාව මත පදනම්ව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

3.2 මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ විශේෂ අවස්ථා

2021 දෙසැම්බර් 31 වන විට, 1995 අංක 15 පනත යටතේ නිරීක්ෂණය කළ යුතු, පනත මගින් දක්වා ඇති නිර්ණායක සපුරා ඇති නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස හඳුන්වනු ලබන ආයතන 1,680ක් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් හඳුනාගෙන ඇත. ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් පෙර වසර වලට අදාළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙම වර්ෂය තුළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 1,517 ක් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,830 ක් ඉදිරිපත් කර තිබුණි. සංසන්ධනාත්මකව සලකා බැලීමේ දී පෙර වසර තුළ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් 1,194ක් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,232ක් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වෙත ඉදිරිපත් කර ඇත.

තාක්ෂණික තනතුරු පහක් පුරප්පාඩු වී තිබියදී වුවද, වසර තුළ සමාලෝචනය කිරීමට සැලසුම් කර ඇති මූල්‍ය ප්‍රකාශන කට්ටල 550 හා සසඳන විට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 525 කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 552 ක සමාලෝචන සම්පූර්ණ කරන ලදී. සංසන්ධනාත්මකව බැලීමේ දී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් 2020 වර්ෂය තුළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 694 කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 732 ක් සමාලෝචනය කර ඇත. සමාලෝචනය කරන ලද මුළු නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වලින්, 48% ක් නියාමනය කරන ලද ආයතන නියෝජනය කරයි. තවද, 2020 වසරේ ආවරණය කරන ලද 24%ට සාපේක්ෂව සමස්තයෙන් 32%ක් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇති සමාගම් විය.

මූල්‍ය ප්‍රකාශන සමාලෝචන වඩාත් ඵලදායී ආවරණයක් සඳහා පහසුකම් සැලසීමට සහ ගෝලීය හොඳම භාවිතයන් සමඟ පෙළගැස්වීම සඳහා 2021 දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් සම්බන්ධ කරගන්නාලද එක්සත් රාජධානියේ උපදේශක විසින් කරන ලද ප්‍රධාන නිර්දේශ කිහිපයක් අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශයන් තෝරාගැනීමේදී මිශ්‍ර ආකෘතියක් අනුගමනය කරමින් සමාලෝචන පැවැත්වීය. එහිදී අවදානම් පාදක ප්‍රවේශයක්, අහඹු සහ මාරුවෙන් මාරුවට යොදාගන්නා ප්‍රවේශයන් ඒකාබද්ධ කරමින් එම ක්‍රියාවලිය සිදුවිය. අවදානම් පාදක ප්‍රවේශය යටතේ කර්මාන්තය කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක මත පදනම්ව කලින් තීරණය කරන ලද තේමා මත සමාලෝචන සිදු කරන ලදී. ඉහත සඳහන් වාර්තා තෝරාගැනීමේදී ඉහළ අවදානම් සහිත ආයතන තෝරා ගැනීම තීරණය කිරීමේදී ආයතනවල මහජන වගවීම පිළිබඳවද සලකා බලන ලදී.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචන සිදු කරන ලදී.

- බැංකු විසින් අවදානම් හෙළිදරව් කිරීම්,
- රක්ෂණ සමාගම් විසින් SLFRS 4, රක්ෂණ ගිවිසුම්වල හෙළිදරව් කිරීමේ අවශ්‍යතා,
- දේපළ වෙළඳාම් අංශයේ ආයතන විසින් සාධාරණ වටිනාකම් මැනීම සහ අදාළ හෙළිදරව් කිරීම්, සහ
- හෝටල් අංශයට කොවිඩ් 19 හි බලපෑම් හේතුවෙන් අබණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ පවතින අනාවරණයන්.

ප්‍රමිතිවල නිශ්චිත අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට කාර්ය මණ්ඩලයට හැකි වූ නව ප්‍රවේශය උසස් තත්ත්වයේ ආයතනික වාර්තාකරණයක් සඳහා අවශ්‍ය වැදගත් වන අංශ හඳුනා ගැනීමට මග පෑදීය.

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021

එහි ප්‍රතිඵලයක් වශයෙන්, සම්පූර්ණ කරන ලද සමාලෝචන වලින් 48%ක් නියාමනය කරන ලද ආයතන නියෝජනය කරන අතර ආසන්න වශයෙන් 52%ක් පුද්ගලික ආයතන නියෝජනය කරන ලදී. සමාලෝචනය කරන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි මෙම සංයුතිය මගින් සැලසුම් කර ඇති අවුරුදු 3-5 චක්‍රය තුළ ආවරණය කිරීමට නියමිත පුද්ගලික ආයතන වල මූල්‍ය ප්‍රකාශන ආවරණය කිරීම පහසු කිරීම අපේක්ෂා කෙරේ.

2019 වසරේ සිට තාක්ෂණික තනතුරු තුනක් පුරප්පාඩු වී පැවතීම සහ වසර තුළ එක් තාක්ෂනික අධ්‍යක්ෂකවරයෙකු ඉල්ලා අස්වීම හේතුවෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි අධ්‍යක්ෂ තාක්ෂණික තනතුරු දෙකක් සහ සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික තනතුරු දෙකක් වසර පුරා පුරප්පාඩු වී තිබේ. 2021 වර්ෂය තුළ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි සේවයේ නියුතු ප්‍රවීණ වරලත් ගණකාධිකාරීවරුන් බඳවා ගැනීම් සහ පාරිශ්‍රම නිර්ණායක සම්බන්ධ ගැටළු සාර්ථකව නිරාකරණය කිරීමට මුදල් අමාත්‍යාංශයට නොහැකි වූ බැවින් ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීමට නොහැකි විය. තවද, 2020 අවසාන කාර්තුව තුළ එක් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස උසස් කිරීමත් සමඟ, සමස්තයක් වශයෙන්, වසර අවසන් වන විට තාක්ෂණික තනතුරු පහක් පුරප්පාඩු ව පවතින අතර ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි මූල්‍ය ප්‍රකාශන සමාලෝචන මෙන්ම විගණන පරීක්ෂණ සිදු කිරීම සඳහා වසර අවසාන වන විට පරීක්ෂණ කාර්ය මණ්ඩලයේ 8 දෙනෙකු පමණක් සිටි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්ෂණ සංඛ්‍යාව අඩු විය.

3.3 මණ්ඩලයේ කාර්යසාධන සංඛ්‍යාලේඛණ

	2018	2019	2020	2021
1. හඳුනාගන්නා ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව (කාලච්ඡේදයේ අවසාන දිනට)	1,579	1,608	1,657	1,680
2. ලැබුණු මූල්‍ය ප්‍රකාශන				
මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව (වර්ෂ කිහිපයක් සඳහා ලද මූල්‍ය ප්‍රකාශන ඇතුළුව)	1,567	1,635	1,232	1,830
නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සංඛ්‍යාව	1,457	1,521	1,194	1,517
3. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය				
සමාලෝචන සංඛ්‍යාව	638	720	732	552
නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සංඛ්‍යාව	608	699	694	525
4. සමාලෝචන වලින් සොයාගත් දෑ				
4.1 අනුකූලවීම්				
මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව	430	450	437	312
නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සංඛ්‍යාව	413	440	421	302
4.2 නිවැරදි කිරීම් සහිතව අනුකූල වීම්				
මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව	202	267	293	237
නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සංඛ්‍යාව	193	256	274	226
4.3 අනුකූල නොවීම් (එකඟතාවයන්, විධානයන්, අනතුරු ඇඟවීම්)				
මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව	6	3	2	3
නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා සංඛ්‍යාව	6	3	2	3
5. මූල්‍ය ප්‍රකාශන වලින් සොයා ගැනීම්				
සමාලෝචනය කල මූල්‍ය ප්‍රකාශන වල % ලෙස				
අනුකූලවීම්	67%	62%	59%	56%
වැඩිදියුණු කිරීම් හඳුනා ගැනීම් සහිතව අනුකූල වීම්	32%	37%	40%	43%
	99%	99%	99%	99%
අනුකූල නොවීම් (එකඟතාවයන්, විධානයන්, අනතුරු ඇඟවීම්)	1%	1%	1%	1%

සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් 1%ක් අනුකූල නොවන බව 2021 වර්ෂයේ සමාලෝචන සොයාගැනීම් මගින් අනාවරණය විය. සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් 56%ක් අනුකූල බවත්, මූල්‍ය ප්‍රකාශන වලින් 43%ක් ආධාර ලිපි මගින් සන්නිවේදනය කරන ලද නිරීක්ෂණ වලට අනුකූල බවත් අනාවරණය විය. වසර තුළ දී උපදේශක විසින් නිර්දේශ කරන ලද වෙනස් කරන ලද ප්‍රවේශයේ ප්‍රතිඵලයක් ලෙස සිදු කරන ලද කේන්ද්‍ර ගත සමාලෝචන වලින් අනාවරණය වූ සොයාගැනීම්

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021

හේතුවෙන් සහයක ලිපි මගින් සන්නිවේදනය කරන ලද එවැනි සොයාගැනීම් වැඩිවීමට හේතු විය.මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය සැලකිය යුතු ලෙස වෙනස් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අදාළ නියමයන් වලින් ප්‍රමාණාත්මක බැහැරවීම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් තුනක මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන ඇත.
ඒ අනුව, ඊළඟ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් වගකීම් ආකාරයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ලබා ගන්නා ලදී. ඉහත කී නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායන් දෙකක ශුද්ධ වත්කම් රු. මිලියන 733 ක වර්ධනයක් පෙන්නුම් කරන අතර අනෙත් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි බලපෑම තවමත් තීරණය කර නොමැත.

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිතා කරමින් ක්‍රියා පටිපාටි භාවිතා කිරීමට තරම් අවශ්‍ය නොවන මට්ටමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගෙන් බැහැරවීම් අනාවරණය වූ අතර ඒ සම්බන්ධයෙන් පුළුල් ලෙස පරීක්ෂණ සිදු නොකර, නිරීක්ෂණ ලිපි මගින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත ඒ පිළිබඳ දැනුම් දෙන ලදී. එබැවින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හට අවශ්‍ය අවස්ථා වලදී, තමන් විසින්ම, අනුකූලතාවය වැඩි දියුණු කළ හැකිවනු ඇත.
වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 237ක් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලිපි නිකුත් කරන ලදී.
(2021 දී සිදුකරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම් පිළිබඳ විස්තර සඳහා පිටු අංක 20 සිට 24 දක්වා සහ 2021 තුළ ලබාගත් චිකඟතාවයන් සඳහා පිටු අංක 25 බලන්න.)

4. විගණන පරීක්ෂාව

පූර්ව වර්ෂය තුළදී පරීක්ෂා කරන ලද සමාගම් 7ක් විසින් සිදු කරන ලද විගණන 27 සමඟ සැසඳීමේ දී මෙම වසර තුළ, වරලත් ගණකාධිකාරී ආයතන 17ක් විසින් සිදු කරන ලද විගණන 34ක් පරීක්ෂාවට ලක් කරන ලදී. 2021 වර්ෂය තුළ විගණන පරීක්ෂණ නියමිත වේලාවට පැවැත්වීමට සැළසුම් කිරීම හේතුවෙන්, වර්ෂය තුළ මුහුණ දීමට සිදුවූ රට වසා තැබීමේ ක්‍රියාවලිය මධ්‍යයේ වුවද, බාධාවකින් තොරව පරීක්ෂණ පවත්වාගෙන යාමට කාර්ය මණ්ඩලයට හැකිවිය. පෙර වසර හා සසඳන විට මෙමගින් වසර තුළදී වැඩි විගණන පරීක්ෂණ ප්‍රමාණයක් පැවැත්වීමට හැකි විය.
ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ලද වැඩ පත්‍රිකා සහිත නියැදියේ සියලුම විගණන මාර්ගගතව පරීක්ෂා කරන ලදී. වැඩ පත්‍රිකා භෞතික ස්වරූපයෙන් තිබීම හේතුවෙන් භෞතිකව පරීක්ෂා කරන ලද විගණන සංඛ්‍යාව, පරීක්ෂා කළ විගණන වලින් 20%කට වඩා අඩු ප්‍රමාණයක් විය.

තේමාත්මක විගණන පරීක්ෂණ සිදු කිරීමේදී සමාජ දුරස්ථභාවය අබණ්ඩව පවත්වා ගැනීමේ අවශ්‍යතා සහ සෘජු සම්බන්ධතා පැවැත්ම පිළිබඳව පැවති සීමාවන් හේතුවෙන්, වසර තුළ තේමාත්මක විගණන පරීක්ෂණ සිදු කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සැලසුම් නොකළේය. කෙසේ වෙතත්, වසර තුළ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් 2019 වසරේ සිදු කරන ලද තේමාත්මක විගණන පරීක්ෂණවල සොයාගැනීම් සහ වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු අවසන් කරන ලදී.

වර්ෂය තුළ පරීක්ෂණ සිදු කරන ලද විගණන ලිපිගොනු අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් මත තෝරා ගන්නා ලදී.

2021 වර්ෂය තුළ සිදු කරන ලද පරීක්ෂණ වල සොයාගැනීම් මගින් පරීක්ෂා කරන ලද විගණනවලින් 62%ක් අනුකූල බවත්, විගණනවලින් 35%ක් ව්‍යවස්ථාව යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නොවන සොයාගැනීම් වූ බවත් අනාවරණය විය. මෙම නිරීක්ෂණ සහාය ලිපි මගින් අදාළ විගණකවරුන් වෙත දන්වා ඇත. ඒ අනුව, 2020 වසර තුළ සමාගම් 3ක් විසින් සිදු කරන ලද විගණන 3 ට සාපේක්ෂව ආයතන 4ක් විසින් සිදු කරන ලද විගණන 4 ක අඩුපාඩු සම්බන්ධයෙන් නිරීක්ෂණ දැනුම් දෙන ලදී. තවද, විගණන කාර්ය පත්‍රිකා තබා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීම සහ විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණන සැලසුම් කිරීම සහ සිදු කිරීම පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි ලබා නොදීම සම්බන්ධයෙන් විගණකවරයෙකුට අවවාද ලිපියක් නිකුත් කරන ලද අතර අනාගතයේ දී ප්‍රමිතීන්ට අනුකූලව අනලස්ව කටයුතු කරන ලෙස දැණුම් දෙන ලදී.

(2021 කාලය තුළ විගණන පරීක්ෂා කිරීම පිළිබඳ සොයාගැනීම් සඳහා පිටු අංක 26 සිට 29 දක්වා බලන්න)

5. විමර්ශන

5.1 ඇඩම් කැපිටල් පොදු සමාගම

ඇඩම් කැපිටල් පෞද්ගලික සමාගමේ මින් පෙර කටයුතු කළ විගණකවරයා විසින් 2014 සහ 2015 මාර්තු 31 න් අවසන් වූ වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සමාගම විසින් නිසි ගිණුම් පොත් සහ අදාළ වාර්තා පවත්වාගෙන යාමට අපොහොසත් වීම හේතුවෙන් මතය ව්‍යාචනය කිරීමක් නිකුත් කර තිබුනි. නමුත් ඒ හේතුව පැවතියද වත්මන් විගණකවරයා විසින් 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව තත්ත්වාගණනය නොකළ විගණන මතයක් නිකුත් තිබිණි.

පසුව, මණ්ඩලය විසින් එම මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කරන ලෙස සමාගම වෙත නියෝගයක් නිකුත් කළ අතර නැවත විගණනයක අමතර වියදම් දැරීමට සමාගම අකමැති විය. අනතුරුව, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂාවේ දී එම විගණකවරයා දිගින් දිගටම විගණන ප්‍රමිතීන් උල්ලංඝණය කර ඇති බවත්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර නොමැති බවත් අනාවරණය විය. විගණකවරයාට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ලබා ගැනීම මත ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021

සාක්ෂි රැස්කරමින් සිටී.

6. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ මත කාර්ය සාධනය

2014 සහ 2015 වර්ෂ වල සියලුම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති එකඟතාවය සපුරාලීමෙන් පසු, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අනුකූල නොවීම් පිළිබඳ සොයාගැනීම් වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ වඩා හොඳ ක්‍රමවේදයක් ලෙස සමාලෝචන සඳහා අවදානම් මත පදනම් වූ මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීමක් කරා යොමු විය. ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් වසර 3-5 ක කාලයක් තුළ වාර්ෂිකව සියලුම නියාමනය කරන ලද ආයතන ආවරණය වන පරිදි සියලුම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම පිළිබඳ සලකා බලයි. එහිදී සෑම වසර 3 කට වරක් ඉහළ අවදානම් සහිත පුද්ගලික ආයතන සහ වසර 5 ක් තුළ අඩු අවදානම් සහිත පුද්ගලික ආයතන ආවරණය වන පරිදි ඒවායේ අභිමතය අනුව පවත්නා සීමිත සම්පත් සහිතව එම කාර්යය සිදුකෙරේ.

ඉහළ අවදානම් සහිත ආයතන කෙරෙහි අවධානය යොමු කරන ලද මෙම ප්‍රවේශය ලෝක බැංකුව විසින් ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සහ නියමයන් පිළිපැදීම. 2015 (ROSC) යන වාර්තාව මගින් සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් ඔවුන්ගේ වාර්තාව මගින්ද යෝජනා කරන ලදී. තවද, මෙම ක්‍රමය 2016 සහ 2021 වසර තුළ කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් වල නිරත වූ ජාත්‍යන්තර උපදේශකයින් විසින් ගෝලීය භාවිතයක් ලෙස හඳුනා ගන්නා ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායය වලින් 70% ක් පුද්ගලිකව ලැයිස්තුගත නොකළ ආයතන වන බැවින්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් 2014/2015 සිට ක්‍රියාත්මක කරන ලද සියලුම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සමාලෝචනය වෙනුවට විගණකාධිපතිවරයාගේ නිරන්තර අවධානයට යොමු වූ කාරණයක් වූ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හි මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ වාර්ෂික තේරීම් නිර්ණායක වල යෝග්‍යතාවය පිළිබඳව විගණකාධිපතිවරයා දැනුවත් කරන ලදී.

7. ප්‍රමිති සැකසීම සඳහා සහය වීම

1995 අංක 15 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව සහ විගණන ප්‍රමිති කමිටුව ශ්‍රී ලංකාව තුළ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් අනුගමනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිර්දේශ සහ සහාය ලබා දෙයි.

2021 වර්ෂය තුළ, ඉහත කී කමිටු දෙක විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් අතරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 2021 වෙළුම නිකුත් කිරීම, 2022 සිට බලපැවැත්වීමට නියමිත දැනට පවතින ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් සංශෝධනය කිරීම සහ ගැසට් කිරීම, එම ප්‍රකාශයන් සිංහලට සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කර ඇතුළත් කිරීම, නිරාවරණ කෙටුම්පත් සහ සාකච්ඡා පත්‍රිකාවලට ප්‍රතිචාර දැක්වීම, IFRS/ ISA පිළිබඳව සහ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය සහ ජාත්‍යන්තර විගණන සහ සහතික කිරීමේ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද සංශෝධන පිළිබඳව සාකච්ඡා කිරීම සහ නව හෝ සංශෝධිත ප්‍රමිතීන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම යන කටයුතු ඇතුළත් විය.

ප්‍රමිති සැකසීම සඳහා සහ රට තුළ මූල්‍ය වාර්තාකරණය සඳහා රාමුව සැකසීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් කරන ලද නිත්‍ය දායකත්වය අගයමින්, ප්‍රමිති සැකසීමේ ක්‍රියාකාරකම් වලට සහාය වීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත වාර්ෂික ප්‍රදානයක් ලබාදීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වෙත කටයුතු සංවිධානය කර තිබුණි. පූර්ව කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමේදී, කමිටු දෙකෙහි පිරිවැය අර්ධ වශයෙන් මූල්‍යකරණය කිරීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් අනුගමනය කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත වර්ෂය තුළ රුපියල් මිලියන 4ක් ගෙවන ලදී. (2021 දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රමිති සැකසීම් සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා පිටු අංක 44 සහ 45 බලන්න)

8. ජාත්‍යන්තර සබඳතා

මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ අධීක්ෂණය අනුකූලතා සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් ලොව පුරා සිදුවන වර්ධනයන්ට අනුගතව කටයුතු කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම බොහෝ ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්වය ලබාගෙන ඇත. මෙම අනුබද්ධතාවය ශ්‍රී ලංකා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට අනෙකුත් ගෝලීය නියාමකයින්ගෙන් තොරතුරු සහ සහාය ලබා ගැනීමට සහ හවුල් ක්‍රියාකාරකම් ලෙස බොහෝ නියාමකයින්ට ප්‍රයෝජනවත් වන ක්‍රියාකාරකම් සිදු කිරීමට අවස්ථා විවර කර ඇත.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම පහත සඳහන් ජාත්‍යන්තර සංවිධාන වල සාමාජිකත්වය පවත්වාගෙන යයි

අ) ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) - 2007 වර්ෂයේ පැවති එහි පළමු පූර්ණ රැස්වීමේ සිට සාමාජිකත්වය ලබාගෙන ඇත.

ආ) ජාත්‍යන්තර විගණන සහ තහවුරු කිරීමේ ප්‍රමිති මණ්ඩලයේ (IAASB) උපදේශක කණ්ඩායම - 2007 වර්ෂයේ දී සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

ඇ) ගණකාධිකාරීවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාර ධර්ම ප්‍රමිති මණ්ඩලයේ (IESBA) උපදේශක කණ්ඩායම - 2009 වර්ෂයේ දී සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021

මීට අමතරව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි කාර්ය මණ්ඩලය විසින් වාර්ෂිකව පවත්වනු ලබන ජාත්‍යන්තර ගිණුම්කරණය සහ වාර්තාකරණය පිළිබඳ අන්තර් රාජ්‍ය විශේෂඥයින්ගේ (ISAR) සැසිවාරයේදී ශ්‍රී ලංකාව නියෝජනය කරයි.

ලොව පුරා ව්‍යාප්ත වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය මධ්‍යයේ ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණ භෞතිකව පැවැත්වීම සම්බන්ධයෙන් වැල්ල වූ අභියෝග ජය ගැනීමේ පියවරක් ලෙස ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් සාමාන්‍යයෙන් සහභාගී වන සියලුම ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණ මෙම වසර තුළ මාර්ගගත සැසි ලෙස පැවැත්විණි.

මෙම දැනුම වර්ධනය කිරීමේ ක්‍රියාකාරකම් ප්‍රයෝජනයට ගනිමින්, 2021 වර්ෂය තුළ චක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු උපදේශන කණ්ඩායම් දෙකේ රැස්වීම්වලට සහභාගී වූ අතර චක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයේ පූර්ණ රැස්වීමට සහභාගී විය. තවද, සියලුම තාක්ෂණික කාර්ය මණ්ඩලයට 2021 IFIAR පරීක්ෂණ වැඩමුළුව, IFIAR බලාත්මක කිරීමේ වැඩමුළුව සහ සාමාන්‍ය තත්වයන් යටතේ IFIAR පූර්ණ රැස්වීමේ න්‍යාය පත්‍ර අයිතමයක්ව පවතින ගෝලීය මහජන ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයින් වන විගණන ආයතන වල සංසද සමග මාර්ගගත සැසිවලට සහභාගී වීමට අවස්ථාව ලබා දී ඇත.

IFIAR විසින් පවත්වනු ලබන සැසි සඳහා ලොව පුරා ස්වාධීන විගණන නියාමකයින් සහභාගී වන හෙයින්, මෙම රැස්වීම් සහ සම්මන්ත්‍රණ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සඳහා තොරතුරු හුවමාරු කිරීමේ වේදිකාවක් නිර්මාණය කරයි.

මෙම ගෝලීය සැසිවාර සඳහා සහභාගී වීම ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ ධාරිතා ගොඩනැගීමට අතීතයේ දී මෙන්ම වැදගත් වී ඇති අතර මෙහිදී රැස්වීම්, පරීක්ෂණ වැඩමුළු සහ විගණන නියාමනයට අදාළ සම්මන්ත්‍රණ වලට සහභාගී වීමට මෙන්ම ලොව පුරා සිටින සෙසු විගණන නියාමකයින් සමඟ සාකච්ඡා කිරීමට සහ ජාලගත වීමට හැකියාව ලබා දී ඇත.

ගෝලීය හොඳම භාවිතයන් පිළිබඳ අධ්‍යයන කිරීම ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් රට තුළ නියාමන පරිසරය ශක්තිමත් කිරීම සඳහා එහි නියාමන යාන්ත්‍රණය වෙනස් කිරීමට ඉවහල් වී ඇත.

එමෙන්ම, මෙම ජාල ගත යාන්ත්‍රණයන් හරහා, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට මූල්‍ය වාර්තාකරණය සහ මූලාශ්‍ර නියාමනය කිරීමේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් උපදේශකයෙකු ලෙස හඳුනා ගැනීමට හැකි වූ අතර එමඟින් ආශ්‍රිත අවදානම් මත පදනම්ව වෙනස් වූ ප්‍රවේශයන් සමඟ මූල්‍ය වාර්තා වඩාත් යෝග්‍ය ලෙස ආවරණය කිරීමට හැකි විය.

9. මානව සම්පත්

9.1 කාර්ය මණ්ඩලය

2021 දෙසැම්බර් 31 වන විට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ සම්පූර්ණ කාර්ය මණ්ඩලය 17 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් 10 දෙනෙකු වරලත් ගණකාධිකාරීවරුන් විය. සමස්ත තාක්ෂණික කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත විය. තාක්ෂණික කාර්ය මණ්ඩලයෙන් තිදෙනෙක් පසුගිය කාලයේ මුදල් අමාත්‍යාංශයෙන් පහසුකම් සැලසූ පරිදි කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති අතර හත් දෙනෙක් ස්ථිර පදනමින් සේවයේ යොදවා ඇත.

අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස උසස්වීම හේතුවෙන් 2020 අවසන් කාර්තුව තුළ පුරප්පාඩු වූ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධූරය, 2019 ජනවාරි මාසයේ සිට පුරප්පාඩු වූ අධ්‍යක්ෂ තාක්ෂණ තනතුර, 2019 අවසානයේ සිට පුරප්පාඩු වූ සහකාර අධ්‍යක්ෂ පුරප්පාඩු 2ක් ඇතුළු තාක්ෂණික තනතුරු පුරප්පාඩු 5ක් 2021 වසර පුරා ද පුරප්පාඩුව පැවතුනි. අමාත්‍යාංශ චක්‍රලේඛවලට අනුව අදාළ වැටුප් පරිමාණයන් අනුව මනා පළපුරුද්ක් ඇති, තාක්ෂණික වශයෙන් ප්‍රවීණ වරලත් ගණකාධිකාරීවරුන් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සමත් නොවීම මෙයට හේතු විය. කෙසේ වෙතත්, මණ්ඩලය අමාත්‍යාංශය සමඟ පැවැත්වූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වෙත වෘත්තීයමය වශයෙන් දක්ෂ වරලත් ගණකාධිකාරීවරුන් ආකර්ෂණය කර ගැනීම සඳහා වැටුප් ලබාදීමට 2021 ජුනි මාසයේදී කැබිනට් අනුමැතිය ලබා දෙන ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පදනම්ව චක් තනතුරු සඳහා 2021 අගෝස්තු මාසයේදී සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය (SoR) ඉදිරිපත් කරන ලද අතර, නියාමන ආවරණය වැඩි දියුණු කිරීම පිණිස ඉහත සඳහන් කළ වෘත්තීය තනතුරු පිරවීම සඳහා කටයුතු කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චකඟතාවය අපේක්ෂාවෙන් සිටී.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් වර්ෂය තුළ නියමිත බඳවා ගැනීමේ ක්‍රියාවලිය අනුගමනය කරමින්, 2018 වසරේ අනුමත කරන ලද මූල්‍ය හා පරිපාලන විධායක නිලධාරී තනතුර පුරවන ලද අතර එය අභ්‍යන්තර උසස්වීමක් මගින් සිදුකරන ලදී. මීට අමතරව, පුරප්පාඩු වූ ලේකම් තනතුර ද වර්ෂයේ අවසාන කාර්තුවේදී පුරවන ලදී. කෙසේ වෙතත්, වර්ෂය අවසානය වන විට වත්මන් සේවක සංඛ්‍යාව තුළ විධායක ශ්‍රේණියේ පුරප්පාඩු 5ක් පැවතිනි. මෙය 2018 නව සේවක සංඛ්‍යා අනුමැතියෙන් පිරවීමට නියමිත විධායක ශ්‍රේණියේ තනතුරු 7 ට අමතරව පුරප්පාඩුව පවතින තනතුරුවේ.

අපේක්ෂිත මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්ෂණ සංඛ්‍යාව සිදුකිරීම සීමා කරමින් සමාලෝචන කටයුතුවල නියැලී සිටින දක්ෂ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ පැවැති අඛණ්ඩ හිඟය, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ මූලික සමාලෝචන කාර්යයන් සිදු කිරීම සඳහා වසර ගණනාවක් පුරා ලබා ගත් බාහිර සමාලෝචක මණ්ඩලයේ සේවය වර්ෂය තුළ දී ද අඛණ්ඩව ලබා ගැනිනි. තවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021

අර්ධ සුදුසුකම් සහිත අභ්‍යාසලාභීන් දෙදෙනෙකු නියාමන කටයුතුවල නියැලී සිටින කණ්ඩායමට සහාය වීම සඳහා සීමාවාසිකයින් ලෙස සම්බන්ධ කර ගන්නා ලදී.

කෙසේ වෙතත්, තාක්ෂණික කාර්ය මණ්ඩලයේ උග්‍ර හිඟය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය සීමා කිරීම සඳහා මූලික ලෙස බලපා ඇති අතර, මෙම ගැටළු හැකිතාක් විසඳීමට මණ්ඩලය සෑම උත්සාහයක්ම ගෙන ඇත. එසේ කිරීමේදී, මණ්ඩලය විසින් මුදල් අමාත්‍යාංශයේ සහ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ රේඛීය අමාත්‍යාංශය වන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ඉහත සඳහන් කාර්ය මණ්ඩල සම්බන්ධ ගැටලුව සාකච්ඡා කර ඇති අතර, නියාමන කාර්යය ශක්තිමත් කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ වල සුදුසු අනුමැතියන් අපේක්ෂාවෙන් සිටී.

9.2 බාහිර සමාලෝචක මණ්ඩලය

2012 වසරේ කෝප් කමිටුවේ නිර්දේශ වලට අනුකූලව කටයුතු කිරීමේ පියවරක් ලෙස, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් තම කාර්ය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාව වැඩි කිරීමට දරන ලද ප්‍රයත්නයේ දී ලැබුණු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සඳහා බාහිර සමාලෝචකයින් සම්බන්ධ කර ගන්නා ලදී. වර්ෂය තුළ, කාර්යාල ස්ථානයට ඇති සීමා සහිත ප්‍රවේශය සහ සමාජ දුරස්ථ අවශ්‍යතාවය හේතුවෙන්, බාහිර සමාලෝචන මණ්ඩලයට එක් නව බාහිර සමාලෝචකයෙකු බඳවා ගන්නා ලද අතර, බාහිර සමාලෝචකයින් විසින් සිදු කරන ලද සමාලෝචන වල ගුණාත්මක භාවය පිළිබඳ සිදුකරන ලද කාලානුරූපී ඇගයීම මත පදනම්ව කිසිදු සමාලෝචකයෙකු සේවයෙන් ඉවත් කර නොමැත. ඒ අනුව, වසර අවසානයේදී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් බාහිර සමාලෝචකයින් 16 දෙනෙකු සම්බන්ධ කර ගන්නා ලදී.

සමාලෝචකයන්ගේ කාර්යයේ ගුණාත්මක භාවය පිළිබඳ වරින් වර කරනු ලබන ඇගයීම, බාහිර සමාලෝචකයින් විසින් පවත්වනු ලබන සමාලෝචන වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ඉවහල් වෙයි. සමාලෝචකයින් තුළ අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදුකළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ සන්නිවේදනය කිරීමට හැකියාවද එමඟින් ඇතිකරයි.

වසර තුළ සම්පූර්ණ කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ප්‍රමාණයට මූල්‍ය ප්‍රකාශන කට්ටල 122 ක් ඇතුළත් බාහිර සමාලෝචකයින් විසින් මූලික සමාලෝචන නිම කරන ලද වර්ෂය තුළ බාහිර සමාලෝචකයින් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 101 ක මූලික සමාලෝචන සිදු කර ඇති අතර ඔවුන්ගේ සේවාවන් සඳහා රුපියල් මිලියන 0.5 ක ගෙවීම් සිදුකරන ලදි. එම සමාලෝචන අවසන් කිරීමේදී, සොයාගැනීම් මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි තාක්ෂණික කාර්ය මණ්ඩලයට අමතර තොරතුරු ලබා ගැනීමට, නිවැරදි කිරීම් සඳහා එකඟතා ලබා ගැනීමට සහ නිරීක්ෂණ ලිපි නිකුත් කිරීමට සහ ව්‍යවස්ථාව යටතේ නිවැරදි ක්‍රියා මාර්ග ගැනීමට සිදු විය. තවද, වර්ෂය තුළ අවසන් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන වල මූල්‍ය ප්‍රකාශන කට්ටල 430 ක මූලික සමාලෝචන ද මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

10. පාලනය

ව්‍යවස්ථාවේ නියමයන්ට අනුව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සාමාජික මණ්ඩලයක් මඟින් පාලනය වේ.ඒ අනුව, නිල බලයෙන් පත්වන සාමාජිකයින් තිදෙනෙකු ගෙන් සහ හඳුනාගත් ආයතන වලින් ලැබුණු නාමයෝජනා වලින් මුදල් අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් 10 දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් යන අය නිල බලයෙන් පත්වන සාමාජිකයින් වේ. මුදල් අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින්, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (සාමාජිකයින් 3), චක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාව, ශ්‍රී ලංකා නීතීඥ සංගමය, ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනය, ශ්‍රී ලංකා බැංකු සංගමය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කළ අය වේ. පත්කරන ලද සාමාජිකයෙකුගේ ධූර කාලය වසර හතරකි.

ව්‍යවස්ථාවට අනුව සංයුතිය සම්පූර්ණ කරමින් 2020 වර්ෂයේ දී පත් කරන ලද මණ්ඩලය, 2021 වසර තුළ දී ද ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති කේ එම් ඒ එන් දවුලාගල මහත්මියගේ සභාපතිත්වය යටතේ කටයුතු කළේය.

වර්ෂය තුළ ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වන ඒ. ගුණසේකර, පී.ආර්.ඒ.අයි ගුණරත්න සහ පී.ඩී. සමරසිංහ යන මහත්වරුන් වර්ෂය තුළ ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි අධ්‍යක්ෂවරුන් හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ලෙස සේවය කළහ. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වූ ඩබ්.ඩබ්.ඒ ජයසිංහ සහ ඩබ්ලිව්.ඩබ්ලිව්.පේ.සී පෙරේරා යන මහත්වරු ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යාපාර ව්‍යවසායයන් විගණනය කරනු ලබන ගණකාධිකාරී සමාගම්වල හවුල්කරුවන් ලෙස කටයුතු කළ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු වූ එස්.එම්.එස්.එස්. බණ්ඩාර මහතා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායක අධ්‍යක්ෂවරයෙකු ලෙස සහ ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරන වෘත්තීය ගණකාධිකාරී සමාගමක හවුල්කරුවෙකු ලෙස කටයුතු කළේය.

තවද, එම කාලසීමාව තුළ මණ්ඩලයේ ආරාධිතයෙකු වන ටී.පේ.එස්. රාජාකාරිය මහතා ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරන වෘත්තීය ගණකාධිකාරී සමාගමක හවුල්කරුවෙකු ලෙස කටයුතු කළේය.

මණ්ඩලයේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයක හෝ එහි විගණක සම්බන්ධ කරුණු වලට අදාළ සියලුම ලිපි ලේඛන අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායය හෝ එහි විගණක සමඟ සම්බන්ධකම් ඇති සාමාජිකයින්ට යවන ලිපි ලේඛන වලින් ඉවත් කර ඇත. එවැනි සාමාජිකයින් එම නිශ්චිත

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021

ව්‍යාපාරික ව්‍යවසායයන් වලට අදාළ විෂයයන් පිළිබඳ සාකච්ඡා සඳහා සහභාගී නොවේ.

වරින් වර රට වසා දැමීම සහ අබණ්ඩ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ උපදෙස් මධ්‍යයේ වුවද, මණ්ඩලය විසින් රැස්වීම් නියමිත පරිදි මාර්ගගත රැස්වීම් ලෙස පවත්වන ලදී. ඒ අනුව, වර්ෂය තුළ මණ්ඩලය රැස්වීම් 14 ක් පවත්වන ලදී.

වර්ෂය තුළ මණ්ඩලයේ සාකච්ඡා මගින් සමස්ත මෙහෙයුම් දර්ශක අනුව කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායය සහ විගණකවරුන් සම්බන්ධ සැලකිය යුතු තාක්ෂණික ගැටළු විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආවරණය කරන ලදී. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන් විසින් ප්‍රමිතීන්ට අනුකූල නොවීම, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම, වාර්ෂික අයවැය සහ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධ ගැටළු පිළිබඳව ද මණ්ඩලය සිය අවධානය යොමු කරන ලදී. තවද, පවතින උග්‍ර කාර්ය මණ්ඩල හිඟය හමුවේ සමාලෝචන යාන්ත්‍රණවල කාර්යක්ෂමතාව සහ සඵලතාවය ඉහළ නැංවීමට සම්බන්ධ වූ ආයතනික වාර්තාකරණ නියාමකයාගේ නිර්දේශ සමාලෝචනය කිරීමේ කාර්යයෙහිද මණ්ඩලය නිරත විය. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ ඵලදායී ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු සංවර්ධකයෙකු යොදාගැනීමේ කාර්යයේ ද මණ්ඩලය නිරත විය.

තවද, තාක්ෂණික කාර්යයන් ඉටු කිරීම සඳහා යෝග්‍ය වෘත්තීය කාර්ය මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් පවතින ගැටලූව විසඳීමට මණ්ඩලය දැඩි ප්‍රයත්නයක් ගත්තේය. එකී උත්සාහයන් සහ භාණ්ඩාගාර ලේකම්වරයාගේ යෝජනාවේ ප්‍රතිඵලයක් ලෙස, කාර්ය මණ්ඩල ගැටලූව මඟහරවා ගැනීම සඳහා මණ්ඩලය විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. වැඩිදුර පවත්වන ලද රැස්වීම් සහ ඉදිරිපත් කිරීම් වල ප්‍රතිඵලයක් ලෙස, අමාත්‍ය මණ්ඩලය විසින් 2021 ජුනි මාසයේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සඳහා වැටුප් පරිමාණයක් අනුමත කර ඇත. කෙසේ වෙතත්, 2021 අගෝස්තු මාසයේදී බඳවා ගැනීමේ පරිපාටිය (SoRs) සංශෝධනය කිරීමෙන් මණ්ඩලය එහි දක්වා ඇති අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වා ඇතත්, බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය මේ වන තෙක් නොලැබීම හේතුවෙන් මණ්ඩලයට තවදුරටත් ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි වී තිබේ.

මණ්ඩලයේ කාර්ය ප්‍රතිපත්තියට අනුව, තොරතුරු එක්රැස් කිරීම, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය, විගණන පරීක්ෂා කිරීම, විමර්ශන පැවැත්වීම සහ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීම වැනි ප්‍රමිතීන්ට අනුකූලව අධීක්ෂණය කිරීමට අදාළ නිරන්තර මෙහෙයුම් වසර තුළ අධ්‍යක්ෂ ජනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

11. මූල්‍ය කාර්යසාධනය

වසර තුළ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ ප්‍රධාන මූල්‍ය මූලාශ්‍රය රජය විසින් සපයන ලද අරමුදල් විය. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ ක්‍රියාකාරකම් රජයේ අරමුදල් හරහා මූල්‍යකරණය කරනු ලැබුවද, මණ්ඩලයේ වියදම් සඳහා විකල්පයක් ලෙස, පනත යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන, කොටස් හිමියන්ගේ කොටස් හෝ බදු පසු ලාභය යන්නෙන් වැඩි අගය මත ගණනය කරන ප්‍රතිශතයක සෙස් බද්දක් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් අය කළ හැක, මුදල් යෙදවීම. කෙසේ වෙතත්, මෙම විකල්පයට මුදල් අමාත්‍යාංශය කැමැත්ත පළ නොකළ අතර 2008 ජනවාරි 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන කාලසීමාවන් සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සෙස් බද්ද ගරු අමාත්‍යවරයා විසින් 2008 ඔක්තෝබර් 7 දින ඉල්ලා අස්කර ගන්නා ලදී.

වසර තුළ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම රු. 71,236,691/- ක මුදලක් මෙහෙයුම් කටයුතු සඳහා වැය කරන ලදී. එම වර්ෂය තුළ, කාර්යාලය ඇතැම් කාලසීමාවන්හිදී අවම කාර්ය මණ්ඩලයකින් ක්‍රියාත්මක වූ අතර අනෙකුත් කාර්ය මණ්ඩලය නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේදය හරහා නියාමන කටයුතු වල නිරත විය. කෙසේ වෙතත්, 2021 අවසාන කාර්තුවේ සිට, සියලූම කාර්ය මණ්ඩලය සේවයට වාර්තා කරමින් කාර්යාලය ක්‍රියාත්මක විය. සාපේක්ෂව, 2020 වසරේ සැලකිය යුතු කාල පරිච්ඡේදයක් නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමවේදය යටතේ සිදු වූ දුරස්ථ වැඩ ක්‍රමවේදය සහ රොස්ටර් පදනම මත කාර්යාලයට පැමිණ වැඩ කිරීමේ සෘජු ප්‍රතිඵලයක් ලෙස 2020 වර්ෂයේ රු. 67,467,943/- ක් වූ මෙහෙයුම් වියදම 2021 වර්ෂයේ මෙහෙයුම් වියදමට වඩා අඩු විය.

වසර අවසාන භාගයේදී පරිශ්‍රයේ බදු දීම අලූත් කිරීම හේතුවෙන් පරිශ්‍රයේ කුලිය ඉහළ ගිය අතර, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචන යාන්ත්‍රණයේ සහ කාර්ය මණ්ඩලයේ අදාළ පුහුණුවෙහි කාර්යක්ෂමතාව වැඩිකිරීම සඳහා විදේශීය විශේෂඥයෙකුගෙන් උපදේශන සේවා සලසා ගැනීම හේතුවෙන් පුහුණු හා සංවර්ධන වියදම් ඉහළ ගියේය. තවද, මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීකෂණ දුරස්ථව සිදුකිරීමට නිවසේ සිට වැඩ කටයුතු වල නිරත වූ කාර්ය මණ්ඩලය සඳහා ලබාදී ඇති අන්තර්ජාල පහසුකම් තිබූ වියදම් ද, වැඩිවීමට හේතුවෙන් සන්නිවේදන වියදම් ද, වාහන නඩත්තු වියදම් ද ඉහළ ගිය අතර, වසර 8-11 කට වැඩි කාලයක් භාවිතා කරන වාහන සම්බන්ධයෙන් වර්ෂය තුළ දරන ලද නඩත්තු හා අලූත්වැඩියා වියදම් ද ඉහළ ගියේය.

මෙහෙයුම් වියදම්වල අඩුවීම ප්‍රධාන වශයෙන් කාර්ය මණ්ඩල පිරිවැය, බාහිර සමාලෝචකයින්ට ගෙවන වෘත්තීය ගාස්තු සහ ජාත්‍යන්තර සාමාජිකත්වය සඳහා වන වියදම් සම්බන්ධයෙන් දක්නට ලැබුණි. කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගේ ඉල්ලා අස්වීම් සහ බඳවා ගැනීම් වර්ෂයේ අවසාන භාගයේදී සිදු කිරීම කාර්ය මණ්ඩල පිරිවැය අඩුවීමට හේතු විය. කෙසේ වෙතත්, පසුගිය වසර හා සසඳන විට, වසරේ

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021

මෙහෙයුම් පිරිවැයේ වැඩි වීමක් පෙන්නුම් කළේ නිවසේ සිට වැඩ කිරීම පදනම් කරගත් ක්‍රියාකාරිත්වය මෙන්ම මෙහි විස්තර කර ඇති වියදම් වැඩිවීම හේතුවෙන් පෙර වසර තුළ ඇති වූ අඩු මෙහෙයුම් පිරිවැයයි.

මෙහෙයුම් වියදම් වලින්, වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැය රු. 35,496,277/- ක් වූ අතර එය පූර්ව වර්ෂයේ පිරිවැය වූ රු. 36,922,897/- හා සසඳන විට සාපේක්ෂව 4%ක අඩුවීමක් පෙන්නුම් කරයි. තවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කාර්ය මණ්ඩල පිරිවැය පෙර වසරේ මෙහෙයුම් වියදම් වලින් 56% ක ප්‍රතිශතයක් වූ අතර එය හා සැසඳීමේ දී එය 2021 වර්ෂයේ දී කාර්ය මණ්ඩල මෙහෙයුම් වියදම් වලින් 50%ක් නියෝජනය කළේය.

12. සංවර්ධන ව්‍යාපෘති

වසර තුළ නියාමන ක්‍රියාවලි කඩිනම් කිරීමේ අරමුණ ඇතිව ප්‍රධාන ප්‍රාග්ධන ස්වභාවයේ ක්‍රියාකාරකම් තුනක් කෙරෙහි මණ්ඩලය විසින් අවධානය යොමු කරන ලද අතර එම ව්‍යාපෘති වල ප්‍රගතිය පහත විස්තර කෙරේ.

12.1 කාර්යාලය පුළුල් කිරීම

වෙළඳපල කුලී අනුපාත ඇගයීමේ ප්‍රතිඵලයක් ලෙස, වර්තමාන කාර්යාල පරිශ්‍රයේ බදු ගිවිසුම 2021 ජූලි මාසයේදී සාකච්ඡා කරන ලද මිලට අලුත් කරන ලද අතර එය සම්පූර්ණ නැවත ස්ථානගත කිරීමකට සාපේක්ෂව වඩා ලාභදායී විය. 2018 වර්ෂයේදී අනුමත කරන ලද සේවක සංඛ්‍යාවේ අතිරේක කාර්ය මණ්ඩලය සඳහා දැනට පවතින කුලී පදනම මත ලබාගෙන ඇති කාර්යාල පරිශ්‍රයේ පළමු මහලේ අභ්‍යන්තර කොටස් කිරීමේ කටයුතු කරගෙන යාම අත්‍යවශ්‍ය වේ. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන්ගේ ඉහළ ආවරණයක් නියාමනය කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට පහසුකම් සැලසීම සඳහා වර්ධනය වූ සේවක සංඛ්‍යාවක් අත්‍යවශ්‍ය වන අතර එමඟින් රටේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

සවිස්තරාත්මක බිම් සැලැස්ම අවසන් කිරීම සහ 2019 දී කොටස් කිරීමේ කාර්යයේ ඉදිකිරීම් පිරිවැය විශ්ලේෂණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, සහ වසර තුළදී කල්බදු අබණ්ඩව පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වසර තුළදී ද කොටස්වලට බෙදා වෙන්කිරීමේ කිරීමේ කටයුතු සඳහා ලංසු කැඳවීය. කෙසේ වෙතත්, ලැබුණු ලංසු ඇගැයීමේදී, රජය විසින් 2021 සහ 2022 දී ප්‍රාග්ධන වියදම් කප්පාදු කිරීම හේතුවෙන් පරිශ්‍රය මිලදී ගැනීමෙන් පසු දෙවන වරටත් අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු නතර කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ලංසුකරුවෙකු ලබා ගැනීමට අදාළව සිදු කරන ලද කාර්යයන් සඳහා සහ සැලසුම් කර ඇති අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශකයින්ගේ සේවාවන් සඳහා වසර තුළ රු. 346,679/- ක් වැය කරන ලදී.

12.2 ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සංවර්ධනය කිරීම

කළමනාකරණ තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ දිගුකාලීන අවශ්‍යතාවයක් විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය පිරිණැමීමේ අවධියේ දී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතියේ උපදේශකයා මෙන්ම මූල්‍ය සපයන්නා ලෙස කටයුතු කිරීමෙන් ඉවත්වීම හේතුවෙන් 2016 වසරේ සිට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ලබා ගැනීමට ගත් උත්සාහයන් සඵල නොවීය. ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම පිණිස කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතිය සඳහා උපදේශකයෙකු සොයා ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් පසුව ගත් උත්සාහයන් ද සාර්ථක නොවීය.

කළමනාකරණ තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය මණ්ඩලය විසින් ප්‍රධාන අවශ්‍යතාවයක් ලෙස සලකනු ලැබීමත් සමඟ තාක්ෂණය පදනම් කරගත් සමාජයක් සහ සුහුරු ජාතියක් කරා පියනැගීම යන රජයේ වැඩසටහනට සමගාමීව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් දරණ ලද සාමූහික ප්‍රයත්නය 2020 අවසාන කාර්තුව තුළ කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධන කිරීම ඇරඹීමට මග පෑදුවේය. ඒ අනුව, රජයේ අවශ්‍යතාවයට අනුකූලව සහ සහතික කළ අබණ්ඩ සේවා පැවැත්මට අනුව, ICTA ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.මසඳහා වන කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතියේ උපදේශකයා ලෙස නැවත පත් කරන ලදී.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි මෙහෙයුම් සඳහා මධ්‍යගත කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වාදීම මගින්, අතින් පවත්වාගෙන යනු ලබන ලියකියවිලි වල පොදු කාර්ය අවම කිරීම, තොරතුරු ගබඩාකිරීම වැඩිදියුණු කිරීම සහ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය අතර මෙන්ම ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර චිනම් ආයතන සහ ඔවුන්ගේ විගණකවරුන් අතර තොරතුරු කාර්යක්ෂමව හුවමාරු කර ගැනීම අපේක්ෂා කෙරේ.මෙම ක්‍රියාවලිය මඟින් වෘත්තීය කාර්ය මණ්ඩලය සාමාන්‍ය දත්ත සමුදා කළමනාකරණ ක්‍රියාකාරකම් වලින් නිදහස් කර ගැනීමටත්, නියාමන යාන්ත්‍රණය කෙරෙහි වෘත්තීය නිපුණතා උපරිම කිරීමටත් ඔවුන්ට හැකියාව ලබා දීමටත් අපේක්ෂා කෙරේ.

2021 වසර පුරා පැවති කොවිඩ් 19 වසංගතය මධ්‍යයේ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර මෘදුකාංග සංවර්ධක තෝරා ගැනීම සිදුකළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් එහි කළමනාකරණ තොරතුරු පද්ධතිය සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් මෘදුකාංග සංවර්ධකයාට රුපියල් මිලියන 38කට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ අධීක්ෂණය සහ මගපෙන්වීම මත කළමනාකරණ තොරතුරු පද්ධති ව්‍යාපෘතිය එහි ව්‍යාපෘති කාලරාමුවට අනුකූලව ක්‍රමානුකූලව ප්‍රගතියක් ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 අවසාන කාර්තුව තුළ, සංවර්ධක විසින් පවත්වන ලද අවශ්‍යතා වික්‍රැස් කිරීමේ සැසි සම්පූර්ණ කිරීමට සහ

ක්‍රියාකාරකම් සමාලෝචනය 2021

සියලුම මූලික නොවන මොඩියුලර් වල සවිස්තරාත්මක මෘදුකාංග පිරිවිතර අවශ්‍යතා සමාලෝචනය සම්පූර්ණ කිරීමට ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට හැකි විය. මූලික මොඩියුල සම්බන්ධයෙන් අදාළ කටයුතු 2022 ජනවාරි මාසයේදී අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර වත්මන් ප්‍රගතිය මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි කළමනාකරණ තොරතුරු පද්ධතිය 2022 මැද වන විට ක්‍රියාත්මක වීමට අපේක්ෂා කෙරේ.

12.3 මූල්‍ය ප්‍රකාශන සමාලෝචන යාන්ත්‍රණය සමාලෝචනය කිරීම සඳහා උපදේශකයකු සම්බන්ධ කර ගැනීම

2020 වසරේ අවසාන මාසයේ සිට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් යොදාගන්නා ලද වික්සත් රාජධානියේ හිටපු ආයතනික වාර්තාකරණ නියාමකයෙකු, පවතින මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ක්‍රමවේදය පිළිබඳව සමාලෝචනය කර සමාලෝචන ආවරණය කඩිනමින් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වෙනස්කම් නිර්දේශ කළේය. කොවිඩ් 19 වෛරසය පැතිරීම පාලනය කිරීම සඳහා පනවා ඇති සංචාරක සීමා හේතුවෙන් එම උපදේශනය මාර්ගගතව පවත්වන ලදී.

පවතින ක්‍රියාවලිය අධ්‍යයනයට දැනට පවතින සමාලෝචන ක්‍රියාවලිය පිළිබඳ තාක්ෂණික කාර්ය මණ්ඩලය සමඟ පුළුල් සාකච්ඡා, ලේඛන නියැදියක් සමාලෝචනය කිරීම සහ පවතින ක්‍රියාවලීන් සහ ගෝලීය හොඳම භාවිතයන් අතර පවතින පරතරය පිළිබඳ විශ්ලේෂණයක් ඇතුළත් විය.

උපදේශකයා විසින් කරන ලද වැදගත් නිර්දේශ අතරට සමාලෝචනය කිරීමට සුදුසු වාර්තා සංඛ්‍යාවක් සහ නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායය මිශ්‍රණයක්, වැදගත් නිර්ණය පිළිබඳ මග පෙන්වීම, පුළුල් සහ කේන්ද්‍ර ගත සමාලෝචන මිශ්‍රණයක් සහ සමාලෝචන ක්‍රියාකාරකම් ඵලදායි ලෙස සකස් කරන්නන්, විගණකවරුන් සහ ආයෝජන ප්‍රජාව සහ පුළුල් ප්‍රජාවකට සන්නිවේදනය කිරීමේ මාධ්‍යයන් ඇතුළුව සමාලෝචන වල විෂය පථය සහ ගැඹුර සහ යහපත් මූල්‍ය වාර්තාකරණය ප්‍රවර්ධනය කිරීම සහ මූල්‍ය ප්‍රකාශන වල දෝෂ අවම කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු හානිර ක්‍රියාකාරකම් ඇතුළත් විය.

2021 වසරේ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි සමාලෝචන ක්‍රියාවලියට එවැනි නිර්දේශ බොහොමයක් ඇතුළත් කරමින් උපදේශකගේ නිර්දේශ අදියර වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන අතර දැනට පවතින පුරප්පාඩු පිරවීමෙන් පසු ඉතිරි නිර්දේශ ඉදිරි වර්ෂවලදී ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ.

13. මූල්‍ය වාර්තාකරණ පරිසර පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා දායකත්වය

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් නියාමන යාන්ත්‍රණය පිළිබඳව මෙන්ම නියාමන පරිසර පද්ධතිය ශක්තිමත් කිරීමේ අරමුණින් අනුකූල වීමේ අවශ්‍යතා පිළිබඳව ආයතනවල සහ විගණකවරුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමේ ප්‍රයත්නයේ දී පහත පියවර ගෙන ඇත.

- පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය වාර්තාකරණය වැඩිදියුණු කිරීමට හැකි වන පරිදි ඔවුන්ගේ දැනුවත්භාවය කාලීනව වැඩි දියුණු කිරීමේ ප්‍රයත්නයේ දී 2020 වසරේ සිදු කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්ෂා පිළිබඳ සොයාගැනීම් පිළිබඳ වාර්තාවක් 2021 වසරේ පළමු කාර්තුව තුළදී මුල්‍ය ප්‍රකාශන සකස් කරන්නන් සහ විගණකවරුන් වෙත නිකුත් කිරීම.

- වාර්ෂිකව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වෙත නියමිත වේලාවට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් වෙත නිවේදනයක් ප්‍රකාශයට පත් කිරීම.

- ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ නියාමන කාර්යභාරය පාර්ශ්වකරුවන්ට පැහැදිලි කරමින් නිවේදනයක් පළ කිරීම.

- තායිලන්තයේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද 8 වැනි ආසියානු විගණන නියාමක කණ්ඩායමේ (AARG) පරීක්ෂණ වැඩමුළුවෙහි සම්පත් දායකයෙකු ලෙස කාර්ය මණ්ඩල සාමාජිකයෙක් කටයුතු කිරීම.

- දැනුම බෙදාගැනීම පිළිබඳව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කාර්යයේ කොටසක් ලෙස කැළණිය විශ්ව විද්‍යාලයේ ගණකාධිකාරී දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ගිණුම්කරණ පර්යේෂකයන් සහ අධ්‍යාපනඥයින් සඳහා වූ 7 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ දී (ICARE) කාර්ය මණ්ඩල සාමාජිකයෙක් විසින් ඉදිරිපත් කිරීමක් සිදු කිරීම.

14. නව සාමාන්‍යකරණයට යොමුවීම

මූල්‍ය ප්‍රකාශන සකස් කරන්නන්, විගණකවරුන් සහ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින්ම කොවිඩ් 19 වසංගතයේ ප්‍රතිවිපාක අත්විඳිමින් සිටින අතර,ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් සිය කාර්යයභාරය සඳහා වන කැපවීම නොවෙනස්ව පවත්වා ගනිමින් 2021 දී නව සාමාන්‍ය තත්ත්වය සමඟ ඉදිරියට යාමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව නිවේදනයක් නිකුත් කරන ලදී. මෙම ක්‍රියාමාර්ග තුළින් මූල්‍ය ප්‍රකාශන සහ විගණන ඉදිරිපත් කිරීම සහ අධීක්ෂණය කිරීම සහ සාමාන්‍ය පරිපාලනය කෙරෙහි අවධානය යොමු කරයි. මෙම නිවේදනය පාර්ශවකරුවන් සඳහා වන සන්නිවේදනයක් ලෙස නිකුත් කර ඇත.

2021 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

1. දළ විශ්ලේෂණය

වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBEs) විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අබණ්ඩව අධීක්ෂණය කරයි.

එකී කාර්යය ඉටු කිරීමේදී, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් රටේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීමේදී අදාළ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමට පෙළඹවීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් එම මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරනු ලැබේ.

2. ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීම

වසර තුළ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 525ක් නියෝජනය කරමින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 552ක සමාලෝචන කටයුතු සම්පූර්ණ කරන ලදී.

සමාලෝචනය කරන ලද මුළු නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වලින්, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් 48%, ක් නියාමනය කරන ලද ආයතන නියෝජනය කළ අතර 52%, පුද්ගලික ආයතන විය.

මෙම ක්‍රියාවලියේදී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් සමාලෝචනය කරන ලද නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් පනතේ දක්වා ඇති සියලුම කාණ්ඩ නියෝජනය වන බව සහතික කිරීමට සෑම උත්සාහයක්ම ගනු ලැබූ අතර ප්‍රායෝගිකව හැකිතාක් දුරට පුද්ගලික ආයතන වන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වලින් චක්‍රීය ආවරණයක් සිදු කරන ලදී.

3. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි නියාමන සහාය ලබාදීම

COVID 19 වසංගතය මධ්‍යයේ, මූල්‍ය ප්‍රකාශන කාලෝචිත ලෙස සකස් කිරීම සහ නියාමන බලධාරීන්ට නියමිත වේලාවට ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් මුහුණ දෙන අභියෝග දැකීමෙන්, සියලුම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වලට නියාමන අවශ්‍යතා වලට අනුකූල වීමට හැකි වන පරිදි තාවකාලික පියවරක් ලෙස වෙබ් අඩවියේ විස්තර කර ඇති තොරතුරු සහ සන්නිවේදන ක්‍රියාවලිය අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, කැඳවීම සහ ලබා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් අනුගමනය කරන ලද සිය නවීකරණය කරන ලද ප්‍රවේශයන් අබණ්ඩව කරගෙන යනු ලැබේ.

4. අධීක්ෂණය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම

පවතින මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ක්‍රමවේදය සමාලෝචනය කිරීමට සහ ගෝලීය හොඳම භාවිතයන් සමඟ සමගාමීව සමාලෝචන ආවරණය වැඩි දියුණු කිරීම සඳහා සිදුකළ යුතු වෙනස්කම් නිර්දේශ කිරීමේ කාර්යයෙහි නියැලී සිටින විදේශ උපදේශකගේ නිර්දේශ මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් සමාලෝචනය සඳහා අහඹු සහ චක්‍රීය ප්‍රවේශයන් සහිත අවදානම් පාදක ප්‍රවේශයක් ඒකාබද්ධ කරමින් මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම සඳහා මිශ්‍ර ආකෘතියක් අනුගමනය කරන ලදී.

අවදානම් මත පදනම් වූ ප්‍රවේශය යටතේ සමාලෝචනය කිරීම කර්මාන්තය කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක මත පදනම්ව කලින් තීරණය කරන ලද තේමා මත සිදු කෙරේ. ඉහත සඳහන් කර්මාන්ත කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක වලට යටත් නොවන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් තෝරාගනු ලබන්නේ චක්‍රීය ආවරණයක් සිදු කරන ආකාරයට අහඹු පදනමක් මතය.

ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචන කාර්යයේ ප්‍රවේශයන් පහත පරිදි සිදුවේ.

- මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනය
- කර්මාන්තය කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක මත පදනම් වූ තේමා කේන්ද්‍රීය සමාලෝචනය

5. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම නිරීක්ෂණය කිරීම පිළිබඳ ප්‍රතිඵල

වසර තුළ දී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගෙන් ප්‍රමාණාත්මක අපගමනය අනාවරණය වූ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා වගකීම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් තුනකින් ලබා ගන්නා ලදී. එහි ප්‍රථිපලයක් ලෙස ඉහත කී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙකක මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වන ශුද්ධ වත්කම් රුපියල් මිලියන 733කින් වර්ධනය වීමට හේතු වූ අතර අනෙක් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හි බලපෑම තවමත් තීරණය කර නොමැත.

ඒ අනුව, 2021 වර්ෂයේ සමාලෝචන සොයාගැනීම් මගින් සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් 1%ක් අනුකූල නොවන බවත්, සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් 56%ක් අනුකූල බවත්, 43%ක් ආධාර ලිපි මගින් සන්නිවේදනය කරන ලද නිරීක්ෂණවලට අනුකූල බවත් අනාවරණය විය.

පෙර වසර හා සසඳන විට ආධාර ලිපි නිකුත් කිරීමේ දී 3% ක වැඩිවීම සඳහා වසර තුළ සිදු කරන ලද අවධානය යොමු කරන ලද සමාලෝචන වලින් සිදුවූ සොයා ගැනීම් වල වැඩිවීම හේතු විය. මූල්‍ය වාර්තාකරණය වැඩිදියුණු කිරීමේ අරමුණින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 237ක් සම්බන්ධයෙන් වසර තුළ කරන ලද නිරීක්ෂණ ආධාර ලිපි මගින් සන්නිවේදනය කර ඇත.

6. අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් ලබාගත් වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම් පිළිබඳ සොයාගැනීම් වල

2021 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

ප්‍රමාණාත්මකභාවය මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන කට්ටල සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී, නිවැරදි කිරීම් සිදුකිරීමට නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් තුනකින් එකඟවීම ලබා ගත්තේය.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර/ ශ්‍රී.ලං.ගි.ප්‍ර.) හා අනුකූල නොවන පරිදි කටයුතු කිරීම් සම්බන්ධයෙන් යොමු කිරීම් සහිතව වගකීම් ලබාගෙන ඇති අයිතම වර්ග පහත පරිදි වේ.

- මූල්‍ය ප්‍රකාශන වල ගෙවිය යුතු අනෙකුත් ගෙවීම් ලෙස, ව්‍යාපාර සංවිධානයක් තුළ අත්පත් කරන්නා විසින් අසම්භාව්‍ය වගකීම් වැරදි ලෙස හඳුනා ගැනීම (යොමු - SLFRS 37 ඡේද 13 ආ, 14, 16, 17 සහ 20)

- සම්බන්ධිත පාර්ශව වලින් ලැබිය යුතු මුදලින් ආපසු අයකරගත හැකි අගයන් පිළිබිඹු කිරීම සඳහා අදාළ පාර්ශව වලින් ලැබිය යුතු වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා වන දීමනාව හඳුනා ගැනීමට අපොහොසත් වීම. (යොමුව - ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 9 ඡේද 5.5.1)

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතා වලට අනුකූලව, මූල්‍ය සමාගමක කුලීපිට මිලදී ගැනීම් සඳහා ලැබිය යුතු මුදල්, බදු සඳහා ලැබිය යුතු මුදල් සහ අනෙකුත් ණය සහ ලැබිය යුතු ණය අලාභ සඳහා දීමනාව හඳුනා ගැනීමට අපොහොසත් වීම. (යොමුව - SLFRS 9 ඡේද 5.5.1)

2021 වර්ෂය තුළ ලබාගත් එකඟවීම් පිළිබඳ විස්තර 25 වන පිටුවේ දක්වා ඇත.

7. ප්‍රමිතීන්ට අනුකූලවීම වැඩි දියුණු කිරීම සඳහා කරන ලද පුළුල් සමාලෝචන වල සොයාගැනීම් සන්නිවේදනය කරල ලද නිරීක්ෂණ

ප්‍රමාණාත්මක වූ නමුත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිතා කරමින් ක්‍රියා පටිපාටි භාවිතා කිරීම අවශ්‍ය නොවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් බැහැරවීම් සම්බන්ධ නිරීක්ෂණ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත සහය ලිපි මගින් දැනුම් දෙන ලදී, එමගින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හට අනාගතයේදී අනුකූලතාව වැඩිදියුණු කිරීමට කටයුතු කළ හැක.

එවැනි සමාලෝචනය කරන ප්‍රවේශයන් දෙක මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන සමාලෝචන පිළිබඳ සොයාගැනීම් සම්බන්ධ විස්තර පහත දැක්වේ.

7.1 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සිදුකරන ලද පුළුල් සමාලෝචනවල සොයාගැනීම්

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත සහය ලිපි ආකාරයෙන් නිරීක්ෂණ සන්නිවේදනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වල පුළුල් සමාලෝචනයන්හි ප්‍රධාන සොයා ගැනීම් පහත පරිදි වේ.

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 57ක් විසින් ආයතනය නිරාවරණය වන මූල්‍ය උපකරණවලින් පැන නගින අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය, සහ අපේක්ෂිත ණය අලාභ වලින් පැන නගින ප්‍රමාණ පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු, වාර්තාකරණ කාල සීමාව අවසානයේ ප්‍රමාණවත් ලෙස අනාවරණය කර නොමැතිවීම (යොමු - SLFRS 7 ඡේද 31 සිට 42 දක්වා)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 42ක් භාවිතා කරන ලද තක්සේරු ශිල්පීය ක්‍රම, තක්සේරු ක්‍රම සඳහා යෙදවුම්, භාවිතා කරන ලද සැලකිය යුතුලෙස නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු, යෙදවුම් සඳහා සිදු කරන ලද ප්‍රමාණාත්මක ගැලපීම් සහ සාධාරණ වටිනාකම්න් මනිනු ලබන වත්කම් සහ වගකීම් එක් එක් පන්තිය සඳහා වූ සාධාරණ වටිනාකම් ධූරාවලිය ප්‍රමාණවත් ලෙස අනාවරණය කර නොමැති වීම. (යොමුව - SLFRS 13 ඡේද 91 සහ 93)

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ආයතන12 ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 37 ක මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් සම්බන්ධයෙන් හානිකරණය පිළිබඳ වෛෂයික සාක්ෂි පවතින විට, ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් මනිනු ලබන මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය පාඩු සඳහා වන පාඩු දීමනාව හඳුනා ගෙන නොතිබීම. (යොමුව - SLFRS 9 ඡේදය 5.5.1 සහ SME වගන්තිය 11 ඡේදය 11.21)

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ආයතන 3 ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 29 ක භාවිතයට නොගත් බදු අලාභයන් ප්‍රයෝජනයට ගැනීම සඳහා පවතින අනාගත බදු අය කළ හැකි ලාභ ප්‍රමාණය නොසලකා ඉදිරියට ගෙන ගිය බදු පාඩු සම්බන්ධයෙන් විලම්බිත බදු වගකීම් හෝ විලම්බිත බදු වත්කම් හඳුනාගැනීමේදී බදු ගෙවිය හැකි සියලුම තාවකාලික වෙනස්කම් සැලකිල්ලට ගෙන නොතිබීම. (යොමු - SLFRS 12 ඡේද 15, 24, 34 සහ 48 සහ SME වගන්තිය 29 ඡේදය 29.12)

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ආයතන 2ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් 23 ක බදු වියදම් සහ ගිණුම් ලාභය අතර සම්බන්ධය ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොතිබීම සහ බදු අලාභ හේතුවෙන් පැන නගින විලම්බිත බදු වත්කම් හඳුනා ගැනීමට ආධාර වීම සඳහා සාක්ෂි ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොතිබීම (යොමු - SLFRS 12 ඡේදය 81 සහ SME වගන්තිය 29 ඡේදය 29.32)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 23 ක මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් සඳහා අදාළ මිනුම් පදනම් සහ අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් විශේෂිත

2021 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ/හෝ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කර නොමැති වීම.
(යොමුව - ශ්‍රී.ලං.ගි.ප්‍ර 1 ඡේද 112 සහ 117)

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ආයතන 11ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 21ක - දේපල පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ සියලු තොරතුරු අනාවරණය කර නොතිබීම .
(යොමු - ශ්‍රී.ලං.ගි.ප්‍ර 16 ඡේද 77 සහ SME වගන්තිය 17 ඡේදය 17.33)

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ආයතන 12 ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 19ක් අදාළ පාර්ශ්ව සබඳතාවල ස්වභාවය මෙන්ම අදාළ පාර්ශ්ව සමඟ ගනුදෙනු පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොතිබීම.
(යොමුව - ශ්‍රී.ලං.ගි.ප්‍ර 24 ඡේදය 18 සහ SME වගන්තිය 33 ඡේදය 33.9)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 19ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ මතයක් ඉදිරිපත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(යොමුව - 1995 අංක 15 දරන පනතේ 6 (1) වගන්තිය)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 13ක මූල්‍ය උපකරණ වල අපේක්ෂිත ණය පාඩු මැනීමේදී මුදල්වල කාලානුරූප වටිනාකම පිළිබිඹු වී නොතිබීම.
(යොමුව - ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 9 ඡේදය 5.5.17)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 11ක වත්කමක ක්ෂයවීම් එකී වත්කම භාවිතය සඳහා පවතින අවස්ථාවේ සිට හඳුනාගෙන නොතිබීම හෝ භාවිතා කරන ක්ෂයවීම් ක්‍රමය මඟින් වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය විසින් පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන රටාව පිළිබිඹු නොකිරීම.
(යොමුව - ශ්‍රී.ලං.ගි.ප්‍ර 16 ඡේද 55 සහ 60)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 9ක ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල සාධාරණ අගයන් ධාරණ අගයට වඩා ප්‍රමාණාත්මකව වෙනස් වන විට අඛණ්ඩව ප්‍රත්‍යාගණන සිදු කර නොතිබීම.
(යොමුව - ශ්‍රී.ලං.ගි.ප්‍ර 16 ඡේද 31)

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ආයතන 1 ක් ඇතුළුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 7ක, වාර්තාකරණ කාල සීමාව අවසානයේ හානිකරණය පිළිබඳ සාධක පවතින විට, වත්කමක ආපසු ලබාගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කර නොතිබීම. SBEs 7 ක් ඇතුළුව SME අංශයේ 1
(යොමුව - ශ්‍රී.ලං.ගි.ප්‍ර 36 ඡේදය 8 සහ 9 සහ SME වගන්තිය 27 ඡේදය 27.5)

7.2 කර්මාන්තය කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක මත පදනම් වූ කේන්ද්‍රගත සමාලෝචන වලින් අනාවරණය කරගත් සොයා ගැනීම්

මූල්‍ය ප්‍රකාශන සමාලෝචන වඩාත් ඵලදායී ආවරණයක් සඳහා පහසුකම් සැලසීම සඳහා සහ ගෝලීය හොඳම භාවිතයන් සමඟ අනුකූලවීම සඳහා ප්‍රමිතිවල නිශ්චිත අංශවලට අනුකූල වීම සම්බන්ධයෙන් වඩාත් ගැඹුරට අවධානය යොමු කිරීමට හැකි වන පරිදි තෝරාගත් තේමා කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචන සිදු කරන ලදී. හොඳ ආයතනික වාර්තාකරණය සඳහා වැදගත් වන අංග හඳුනා ගැනීම මඟින් අනුගමනය කරන ලද යහපත් භාවිතයන් පිළිබඳව එහිදී අවධානය යොමුකරන ලදී. තවද, මෙමඟින් හිඟ සම්පත් සීමාවන් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම මඟින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හි සමාලෝචන ආවරණය වැඩි කිරීමට මග පෑදීනි.

ඒ අනුව, බැංකු විසින් අවදානම් හෙළිදරව් කිරීම්වලදී හෙළිදරව් කිරීමේ අවශ්‍යතා, රක්ෂණ සමාගම් විසින් ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 4 හි අවශ්‍යතා, දේපළ වෙළඳාම් අංශයේ ආයතන විසින් සාධාරණ වටිනාකම් පිළිබඳ මිණුම් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ අවශ්‍යතා සහ කොවිඩ් 19 හි බලපෑම් හේතුවෙන් හෝටල් අංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචන සිදු කරන ලදී.

කේන්ද්‍රගත සමාලෝචනවල සොයාගැනීම් පහත පරිදි වේ.

7.2.1 බැංකු සහ මූල්‍ය අංශයේ සමාගම් විසින් අවදානම් හෙළිදරව් කිරීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 7, මූල්‍ය උපකරණවල දැක්වෙන හෙළිදරව් කිරීම් අවශ්‍යතා අනුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් කරන ලද අනාවරණයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් බැංකු සහ මූල්‍ය අංශයේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 22 ක මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන ලදී.

සහය ලිපි මඟින් බැංකු වෙත නිරීක්ෂණ සන්නිවේදනය කරන ලද ප්‍රධාන සොයාගැනීම් පහත දැක්වේ.

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 16ක හඳුනානොගැනීම සඳහා ඉවහල් නොවන මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් වෙනස් කිරීමට අදාළව අපේක්ෂිත ණය අලාභවලින් පැන නගින ප්‍රමාණ පිළිබඳ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු සහ අපේක්ෂිත ණය පාඩු මැනීම සඳහා එවැනි වෙනස් කිරීම් වල බලපෑම අනාවරණය කර නොතිබීම.
(යොමුව- ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 7 ඡේද 35 (J))

2021 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 12ක් විසින් අලාභ දීමනාවල වෙනස්වීම් සඳහා මූල්‍ය උපකරණවල දළ ධාරණ අගය පවතින කාලය තුළ සිදුවූ සැලකිය යුතු වෙනස්කම් දායක වී ඇති ආකාරය පිළිබඳ පැහැදිලි කිරීමක් ලබා දී නොතිබීම. (යොමුව - SLFRS 7 ඡේද 35 (I))

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 12ක් විසින් වාර්තාකරණ කාල සීමාව තුළ කපා හරින ලද සහ තවමත් බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් වලට යටත්ව පවතින මූල්‍ය වත්කම් මත හිඟ කොන්ත්‍රාත් මුදල අනාවරණය කර නොතිබීම. (යොමුව - SLFRS ඡේද 35 (L))

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 11ක් විසින් මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට ආයතනයක් ණය අවදානමට නිරාවරණයවීම තක්සේරු කිරීමට සහ එහි සැලකිය යුතු ණය අවදානම් එකතුව පිළිබඳ අවබෝධ කර ගැනීමට හැකි වන පරිදි මූල්‍ය වත්කම්වල දළ ධාරණ අගය සහ ණය අවදානම් ශ්‍රේණිගත කිරීම් මගින් ණය බැඳීම් සහ මූල්‍ය ඇපකර කොන්ත්‍රාත්තු මත ණය අවදානම්වලට නිරාවරණය වීම, හෙළිදරව්කර නොතිබීම. (යොමුව - SLFRS 7 ඡේද 35 (M)

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 11ක් විසින් වාර්තා කරන දිනයේදී ණය හානිකරණයට ලක්වූ මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් තබන ලද ඇපකර සහ අනෙකුත් ණය වැඩි දියුණු කිරීම් (උදාහරණයක් ලෙස, ඇපකර සහ අනෙකුත් ණය වැඩි දියුණු කිරීම් ණය අවදානම අවම කරනු ලබන ප්‍රමාණය ප්‍රමාණ කිරීම) පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබීම. (යොමුව - SLFRS 7 ඡේද 35 (K))

- නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් 11ක් විසින් වත්කම්වල ස්වභාවය සහ ධාරණ අගය, වය සුරක්ෂිතභාවය ලෙස හෝ වෙනත් ණය වැඩි දියුණු කිරීම් සඳහා තබනලද ඇපකර සහ ලබාගන්නාලද වෙනත් ණය වැඩි දියුණු කිරීම් සහ එවැනි වත්කම් අනෙකුත් ශ්‍රී.ලං.මූ.වා.ප්‍රමිතීන්හි හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේද, සහ එවැනි වත්කම් පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ නොහැකි විට, එවැනි වත්කම් බැහැර කිරීම හෝ මෙම කර්තව්‍යයේදී ඒවා භාවිතා කිරීම සඳහා අදාළ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබීම. (යොමුව - SLFRS 7 ඡේද 38)

7.2.2 රක්ෂණ සමාගම් විසින් ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 4 ප්‍රකාරව හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 4, රක්ෂණ කොන්ත්‍රාත්තු වල අවශ්‍යතා අනුව නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් කරන ලද අනාවරණයන් පිළිබඳව රක්ෂණ අංශයේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 24 ක මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන ලදී. සොයාගැනීම් මත පදනම්ව, රක්ෂණ සමාගම් 7ක් විසින් ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 4 හි අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරන ලද අංශ සම්බන්ධයෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකර තිබූ බව අනාවරණය විය.

රක්ෂණ සමාගම් වෙත ආධාර ලිපි මගින් නිරීක්ෂණ සන්නිවේදනය කරන ලද ප්‍රධාන සොයාගැනීම් පහත දැක්වේ.

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 16ක් විසින් රක්ෂණ වත්කම් සහ රක්ෂණ වගකීම් මැනීම සඳහා භාවිතා කරන උපකල්පනවල වෙනස්කම් මූල්‍ය ප්‍රකාශන මත ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරන එක් එක් වෙනස්කමේ බලපෑම වෙන වෙනම පිළිබිඹු වන පරිදි අනාවරණය කර නොමැතිවීම (යොමුව -SLFRS 4 ඡේද 37 (d))

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 13ක් විසින් රක්ෂණ අවදානම පිළිබඳ සංවේදීතාව පිළිබඳ තොරතුරු, (විනම්, ප්‍රතිරක්ෂණ මගින් අවදානම අවම කිරීමට පෙර සහ පසු යන දෙකම) අනාවරණය කර නොමැතිවීම. (යොමුව - SLFRS 4 ඡේද 39 (c) (i))

- නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් 9ක් විසින් රක්ෂණ ගිවිසුම් වලින් පැන නගින අවදානම් කළමනාකරණය සඳහා සමාගමේ අරමුණු, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් සහ එම අවදානම් කළමනාකරණය කිරීමට භාවිතා කරන ක්‍රමවේදය අනාවරණය කර නොතිබීම. (යොමුව - SLFRS 4 ඡේද 39 (අ))

7.2.3 නිශ්චල දේපළ අංශයේ ආයතන විසින් සාධාරණ අගය මැනීම සහ හෙළිදරව් කිරීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 13 හි අවශ්‍යතා අනුව සාධාරණ අගය මැනීම පිළිබඳව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් විසින් කරන ලද අනාවරණයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නිශ්චල දේපල අංශයේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 11 ක මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන ලදී.

ප්‍රධාන සොයාගැනීම් පහත පරිදි වේ.

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 5ක් විසින් භාවිතා කරන ලද තක්සේරු ශිල්පීය ක්‍රම, තක්සේරු ක්‍රම සඳහා භාවිතාකළ යෙදවුම්, භාවිතා කරන ලද නිරීක්ෂණය කළ නොහැකි සැලකිය යුතු යෙදවුම් පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු, යෙදවුම් සඳහා සිදු කරන ලද සැලකිය යුතු ගැලපීම් සහ සාධාරණ වටිනාකමින් මනිනු ලබන වත්කම් සහ වගකීම් එක් එක් පන්තිය සඳහා සාධාරණ වටිනාකම් ධූරාවලියට අදාළ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කර නොතිබීම. (යොමුව - SLFRS 13 ඡේද 91 සහ 93)

7.2.3 කොවිඩ් 19 හි බලපෑමට අදාළව අබණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පන සහ හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව

හෝටල් අංශයේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 36 ක මූල්‍ය ප්‍රකාශන,

2021 දී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

ඒවායේ ව්‍යාපාරික ක්‍රියාකාරිත්වයට කොවිඩ් 19හි බලපෑම සම්බන්ධයෙන් කරන ලද හෙළිදරව්වන්හි ප්‍රමාණවත්භාවය සහ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය භාවිතා කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් සමාලෝචනය කරන ලදී.

ප්‍රධාන සොයාගැනීම් පහත පරිදි වේ.

- නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 2ක් විසින් සිය සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම අවසන් කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් කරන ලද විනිශ්චයන් සම්බන්ධ හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් ලෙස සිදු කර නොතිබීම. (යොමුව - SLFRS 1 ඡේදය 122)

- නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් 2ක් විසින් සිය සමාගමේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස අනාවරණය කර නොතිබීම.ඩි(යොමුව - SLFRS 7 ඡේදය 39)

2021 වර්ෂය තුළ දී ලබාගත් එකඟතාවයන්

1. සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව වෙනත් ව්‍යාපාරික සංවිධානයක් විසින් අත්පත් කර ගැනීම මත පදනම්ව 2019 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල බැංකුව අත්පත් කර ගන්නා ලද තැනැත්තා විසින් හඳුනාගන්නා ලද අසම්භාව්‍ය වගකීම් මත පදනම්ව වැරදි ලෙස රු. මිලියන 882.1ක අසම්භාව්‍ය වගකීම් හඳුනාගෙන ඇත. ඒ අනුව, බැංකුවේ වෙනත් ගෙවිය යුතු දෑ ශේෂය රු. මිලියන 882.1 කින් වැඩියෙන් දක්වා ඇත.

විගණකවරුන් මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය තත්වාගණනය කර නොතිබුණි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් කරන ලද විමසීම් වලින් අනතුරුව, බැංකුව විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37ට අනුකූලව ප්‍රතිපාදන, අවිනිශ්චිත වගකීම් සහ අවිනිශ්චිත වත්කම් වලට අනුකූලවීම පිණිස රුපියල් මිලියන 882.1 ප්‍රතිපාදන 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ආපසු බැංකුව භාරගෙන තිබුණි.

2. ට්‍රිලියම් රෙසිඩන්සීස් ලිමිටඩ්

ට්‍රිලියම් රෙසිඩන්සීස් ලිමිටඩ් විසින් සැලකිය යුතු කාලයක් සඳහා හිඟව පැවති ඇතැම් වෙළඳ ලැබිය යුතු සහ අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ණය අලාභ සඳහා අලාභ දීමනාවක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය SLFRS 9, මූල්‍ය උපකරණවලට අනුකූලව හඳුනාගෙන නොතිබුණි.

ඒ අනුව, ලැබිය යුතු මුදල් සඳහා රුපියල් මිලියන 149.2ක පාඩු දීමනාවක් හඳුනා ගෙන නොතිබීම හේතුවෙන් 2019 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය වත්කම් ප්‍රමාණය වැඩියෙන් දක්වා තිබුණි.

විගණකවරුන් මෙම ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර ඇත. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් කරන ලද විමසීම්වලින් පසුව, සමාගම විසින් 2020 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශනවල රුපියල් මිලියන 40.5ක ලැබිය යුතු ශේෂයන් කපා හැරීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, ඉතිරි රුපියල් මිලියන 108.7ක් සඳහා පාඩු දීමනා වෙන්කිරීමට සමාගම එකඟ නොවීය. ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සමාගම විසින් රුපියල් මිලියන 108.7ක ලැබිය යුතු මුදල් ශේෂය සම්බන්ධයෙන් පාඩු දීමනාවක් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ගත යුතු මීළඟ ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් උපදෙස් විමසන ලදී.

ඒ අනුව 2020 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල අලාභ දීමනාවක් හඳුනා නොගෙන සමාගම ඉහත ලැබිය යුතු මුදල් පිළිබිඹු කරන්නේ නම් සහ හානිකරණ දර්ශක අබණ්ඩව පවතී නම්, සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපතිවරයා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම වෙත උපදෙස් දී ඇත.

3. සී/ස ද ෆිනෑන්ස් සමාගම

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලදී, සී/ස ද ෆිනෑන්ස් සමාගම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය SLFRS 9, මූල්‍ය උපකරණවල ඇති අවශ්‍යතා, කුලීපිට මිල දී ගැනීම් සහ කල්බදු වලින් ලැබී යුතු මුදල් සහ ණය සහ ලැබිය යුතු දේ සඳහා පාඩු දීමනා හඳුනාගැනීමේදී අදාළ කර නොතිබුණි.

විගණකවරුන් මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර තිබුණි. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් කරන ලද විමසීම්වලින් අනතුරුව, 2020 මාර්තු 31 න් අවසන් වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 හි අවශ්‍යතාවයන්ට අනුකූලව, කුලිපිට ගැනුම් හා කල්බදු සඳහා ලැබිය යුතු සහ ණය සහ ලැබිය යුතු - අනෙකුත් උකස් ණය ඇතුළුව අපේක්ෂිත ණය පාඩු සඳහා පාඩු දීමනාවක් හඳුනා ගැනීමට සමාගම කටයුතු කරන ලදී.

2021 තුළදී විගණන පරීක්ෂණ

1. දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම) ප්‍රධාන කාර්යයන් දෙක අතුරෙන් එකක් වනුයේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි (SBEs) විගණකවරුන් විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuS) අනුකූල වීම පිළිබඳ අධීක්ෂණය කිරීමයි.නියැලීමට විශේෂිත වූ නිත්‍ය විගණන පරීක්ෂණ සහ තේමා විශේෂිත විගණන පරීක්ෂණ ලෙස පූර්ව තීරණය කරන ලද තේමාවක් පිළිබඳ පුළුල් සමාලෝචනයක් කෙරෙහි අවධානය යොමු කරමින් අප විසින් විගණන අධීක්ෂණය සිදු කරනු ලබයි. අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් මෙන්ම අහඹු තේරීම් ප්‍රවේශයක් පිළිබඳ සළකා බලා පරීක්ෂා කිරීම සඳහා විගණන තෝරා ගනු ලැබේ.

කොවිඩ් 19 වසංගතයේ අබණ්ඩ ආර්ථික හා සමාජීය බලපෑම හමුවේ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් ව්‍යාපාර වල මෙහෙයුම් කාර්යයන් කෙරෙහි එමගින් එල්ල කරන ලද බලපෑම හඳුනාගෙන ඇති අතර, සාර්ව හා ක්ෂුද්‍ර ව්‍යාපාරික පරිසරයන්හි ඉහළ මට්ටමේ අවිනිශ්චිතතා සහ ගතික වෙනස්කම් පිළිබඳව ද හඳුනාගෙන ඇත. ඉහත තත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් ආයතන වල සැලකිය යුතු මට්ටමේ තීරණ සහ ඇස්තමේන්තු වල අවිනිශ්චිතතාවයන් ඇතිවී තිබේ. මෙම තීරණ සහ ඇස්තමේන්තු වල අවිනිශ්චිතතාවයන් ගිණුම් වල ඇස්තමේන්තු විගණනය හා සම්බන්ධ අවදානම හරහා සමස්ත විගණන අවදානම වැඩි කිරීමට හේතු වී ඇත. මෙම අභියෝග හේතුවෙන් විගණන නිලධාරීන්ට සැලකිය යුතු ප්‍රමාණයක වෘත්තීය විනිශ්චයක් ක්‍රියාත්මක කිරීම, සැක මුසුභාවයෙන් කටයුතු කිරීම සහ විගණන සිදු කිරීමේදී සදාචාරාත්මක වගකීම් කෙරෙහි අවධානය යොමු කිරීමට අවශ්‍ය වී ඇත.

මෙම අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් ඉහළ අවදානම් සහිත ආයතනවල පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් විගණන පරීක්ෂණ සිදු කර ඇත.

- අවදානම් තක්සේරුව - ව්‍යාපාර මෙහෙයුම් සහ පරිසරයන්හි අවිනිශ්චිතතාවයන් සහ ගතික වෙනස්කම් හේතුවෙන් පැන නගින ඉහළ ඒකාබද්ධ අවදානම්

- සමූහ විගණන - සමූහ මට්ටමින් සහ කණ්ඩායම් ව්‍යුහයන් වෙනස් කිරීමේදී හානිකරණ තක්සේරු කිරීම් සම්බන්ධ ඉහළ අවදානම්

- අබණ්ඩ පැවැත්ම සහ පසුකාලීන සිදුවීම් - ව්‍යාපාර වලට කොවිඩ් 19 වසංගතයේ බලපෑම හේතුවෙන්, අබණ්ඩව පවත්වාගෙන යාමට ආයතනයට ඇති හැකියාව සහ වාර්තාකරණ කාල සීමාවෙන් පසු සිදුවීම් වල බලපෑම පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම්/ තත්වයන් පිළිබඳ සාක්ෂි

- වත්කම් තක්සේරු කිරීම - ඉහළ මට්ටමේ අවිනිශ්චිතතාවයක සන්දර්භය තුළ කළමනාකරණය විසින් සිදු කරන ලද විනිශ්චයන්හි වැදගත්කම, ප්‍රධාන උපකල්පන සහ තක්සේරු ආකෘති සඳහා යොදාගන්නාලද වෙනත් යෙදවුම්

2. අබණ්ඩ විගණන පරීක්ෂණ

2020 වසර තුළදී ආයතන 7ක් විසින් සිදු කරන ලද විගණන කටයුතු 27 හා සසඳන විට විගණන ආයතන 17ක් විසින් සිදු කරන ලද විගණන කටයුතු 34ක් මෙම වසර තුළදී පරීක්ෂාවට ලක් කරන ලදී. වසර තුළ පරීක්ෂා කරන ලද විගණන වලට ජාත්‍යන්තර ජාලවල සාමාජිකයන් වන සමාගම් 4ක් විසින් සිදු කරන ලද විගණන 21ක් ඇතුළත් විය.

3. බලාත්මක කිරීම

3.1 බලාත්මක කිරීමේ කටයුතු පිළිබඳ දළ විශ්ලේෂණය

විගණන පරීක්ෂා කිරීම්වලදී කරන ලද නිරීක්ෂණවල ප්‍රභලතාව මත පදනම්ව, ශ්‍රී ලංකාවේ විගණන තත්ත්ව පරිසරය වැඩිදියුණු කිරීමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා විගණකවරුන් දියුණු කර ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරයි.

ව්‍යවස්ථාව යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූල නොවීම් නිත්‍ය විගණන පරීක්ෂණ වල ප්‍රතිඵලයක් ලෙස සොයා ගන්නා විට, එවැනි අඩුපාඩු නිරීක්ෂණ ලිපි යනුවෙන් හඳුන්වන සහය ලිපි මගින් විගණන ආයතන වෙත දැනුම් දෙනු ලැබේ. විගණන ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා වැඩිදියුණු කිරීම් අවශ්‍ය වූ විට, එවැනි වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා ලෙස සන්නිවේදනය කෙරේ. මීට අමතරව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හි විගණනයන් සිදුකිරීමේ දී, වෘත්තීය නිපුණතාවය සහ නිසි සැලකිල්ල පිළිබඳ මූලික සදාචාරාත්මක මූලධර්ම ක්‍රියාත්මක කිරීමට විගණක අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වූ විට, එම සමාගම අනාගතයේ දී මූල්‍ය ප්‍රකාශන විගණනය කරන විට, අදාළ විගණන ප්‍රමිතීන්ගේ අවශ්‍යතා වලට අනුකූලව අනලස්ව කටයුතු කළ යුතු බවට නියම කරමින් මණ්ඩලයේ අනුමැතිය ඇතිව විගණන ආයතනයට අනතුරු ඇඟවීමේ ලිපියක් (Warning Letter) නිකුත් කරනු ලැබේ. තවද, ගැටළු වල වැදගත්කම මත පදනම්ව, අවශ්‍ය අවස්ථා වලදී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් විගණන ප්‍රමිතීන්ගෙන් බැහැරවීම් පිළිබඳ උපදෙස් සඳහා නීතිපතිවරයා වෙත යොමු කරන අතර, විගණනයේ ගුණාත්මක භාවයේ අඩුපාඩු පවතින විට, එවැනි කරුණු බලපත්‍ර අධිකාරිය වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත සහ අදාළ වන පරිදි විගණකවරුන් සහ විගණනය කරනු ලබන ආයතනය පාලනය කරන වෙනත් ඕනෑම නියාමකයෙකුට යොමු කරනු ලැබේ.

2021 තුළදී විගණන පරීක්ෂණ

3.2 වර්ෂය තුළ ගනු ලැබූ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග

3.2.1 නීතිපති වෙත යොමු කිරීම

එක් විගණන පරීක්ෂණයක් නීතිපතිවරයා වෙත යොමු කරන ලද අතර, නීතිපති උපදෙස් මත, නීතිමය පියවර ගැනීම සඳහා සාක්ෂි රැස් කිරීම සිදු වෙමින් පවතී.

3.2.2 අනතුරු ඇඟවීමේ ලිපිය

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි විගණන සිදු කිරීමේදී ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම නිසා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් උදයසිරි කාර්යවසම් සහ සමාගම වෙත අනතුරු ඇඟවීමේ ලිපියක් නිකුත් කරන ලදී. ඒ අනුව, විගණන සමාගම අනාගතයේ දී මූල්‍ය ප්‍රකාශන විගණන සිදු කිරීමේදී, අදාළ විගණන ප්‍රමිතීන්හි අවශ්‍යතා වලට අනුකූලව අනලස්ව කටයුතු කිරීමට නියම කරන ලදී.

3.2.3 ආධාර ලිපිය

ව්‍යවස්ථාව යටතේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නොවන විගණන ප්‍රමිතීන්ට අනුකූල නොවීම පිළිබඳ සොයාගැනීම් සන්නිවේදනය කරමින් වර්ෂය තුළ විගණන කටයුතු 12ක් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලිපි ලෙසින් ආධාර ලිපි සමාගම් 12ක් වෙත නිකුත් කරන ලදී.

4 වැදගත් සොයාගැනීම්

4.1 වංචා පිළිබඳ අවදානම

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදු කිරීමේදී, විගණකවරයා විසින් වංචාව හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල අවදානම හඳුනාගෙන තක්සේරු කිරීම, තක්සේරු කළ අවදානම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීම සහ විගණනය සිදුකරන අතරතුර වංචා හෝ සැක සහිත වංචා සඳහා නිසි ප්‍රතිචාර දැක්වීම සිදුකළ යුතුය. විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචා අවදානම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අප විසින් දැනුම්දෙන ලදී.

- පොදු ලෙජරයේ සටහන් කර ඇති ජර්නල් සටහන්වල යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සහ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අවදානම් කළමනාකරණය කිරීම පාලනය කිරීම පිළිබඳ විගණකවරයාගේ තක්සේරුව නොසලකා සිදු කරන ලද අනෙකුත් ගැලපීම් විගණකවරයා විසින් පරීක්ෂා කළ යුතු වුවද, විගණකවරයා විසින් ජර්නල් සටහන් පරීක්ෂා කර නොතිබුණි.

- ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වංචාව හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන වලට ගොදුරු වීමේ හැකියාව පිළිබඳව සම්බන්ධීකරණ කණ්ඩායම සමඟ සාකච්ඡා නොකිරීම.

- පාලනය සම්බන්ධයෙන් වගකීම් දරන පුද්ගලයින් මෙහෙයුම් පුද්ගලයින්, අභ්‍යන්තර නීති උපදේශකයින් සහ විවිධ මට්ටමේ අධිකාරියක් ඇති සේවකයින් වැනි සමාගමේ සුදුසු පුද්ගලයින්ගෙන් විගණකවරයා විමසීම් කළ යුතුය. එසේ නමුත් ආයතනයක අභ්‍යන්තර විගණන අංශයක් ඇති අවස්ථාවකදී යම් ආයතනයක මූල්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට පමණක් වංචා අවදානම් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සීමා කිරීම සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සුදුසු පුද්ගලයින්ගෙන් විමසීම් නොකිරීම.

- සමහර විගණන කණ්ඩායම් වලට පාලනය සම්බන්ධයෙන් වගකීම් දරණ පුද්ගලයින් යනු කවුරුන්ද යන්න සහ ඔවුන්ගේ කාර්යභාරය සහ පාලනය සම්බන්ධයෙන් වගකීම් දරන පුද්ගලයින් කළමනාකරණ ක්‍රියාවලීන් අධීක්ෂණය කරන්නේද යන්න පිළිබඳව අවබෝධයක් නොතිබුණි.

4.2 ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම

විගණකවරයා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල අවධානම හඳුනා ගෙන තක්සේරු කල යුතු නිසා ඒ සඳහා ආයතනය සහ එහි පරිසරය හා අභ්‍යන්තර පාලනය ගැන දැනුවත් වීමෙන්, විගණන පටිපාටිය සැලසුම් කල හැකි වේ. එයට අදාලව, දැනුම් දෙන ලද බැහැරවීම් වලට පහත සඳහන් දෑ ඇතුළත් විය.

- ආයතනය සහ එහි පරිසරය සහ විගණනයට අදාළ අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ඇතැම් විගණන කටයුතුවලදී දැකිය නොහැකි විය.

- සමහර අවස්ථා වල දී පූර්ණ පරීක්ෂණ මගින් අඩුපාඩු අනාවරණය වූවත්, පූර්ණ පරීක්ෂණ නිසි පරිදි සිදු නොකරන ලද අවස්ථා ද තිබිණි. එවැනි අඩුපාඩු අතර වැදගත් මූලාශ්‍ර ලේඛන පරීක්ෂා නොකිරීම සහ අදාළ ආධාරක ලේඛන සමඟ ගිණුම් සටහන් පරීක්ෂා නොකිරීම ඇතුළත් වේ.

- එක් අවස්ථාවකදී, "සම්පූර්ණත්වය" ප්‍රකාශයට අදාළව හඳුනාගත් පාලන ක්‍රමවේද එම ප්‍රකාශය සඳහා අදාළ නොවීය.

- සමහර විගණන කටයුතු වලදී, තොරතුරු තාක්ෂණ පාලනයන් පරීක්ෂා කර නොමැත. තොරතුරු තාක්ෂණ පද්ධති පාලනයට යෙදුම් පාලන සහ යෙදුම් පාලනවල ඵලදායී

2021 තුළදී විගණන පරීක්ෂණ

ක්‍රියාකාරිත්වයට සහාය වන සාමාන්‍ය තොරතුරු තාක්ෂණ පාලන ඇතුළත් වී තිබිණි.

4.3 ප්‍රමාණාත්මක බව

විගණනය සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණාත්මකබව පිළිබඳ සංකල්පය විගණක විසින් සුදුසු පරිදි යොදාගත යුතුය.

පහත සඳහන් අඩුපාඩු සොයාගෙන තිබුනි.

- ඇතැම් අවස්ථා වලදී, සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශයන් සඳහා වන මිණුම් ලකුණ සහ ප්‍රමාණාත්මක බව සඳහා වන ප්‍රතිශතය සහ කාර්ය සාධන ප්‍රමාණාත්මක බව තීරණය කිරීමට භාවිතා කරන පදනම නිර්ණය කිරීමේදී විගණක විසින් සලකා බලන ලද සාධක පිළිබඳ සාක්ෂි නොමැති විය.

- අවස්ථා කිහිපයකදී, ප්‍රමාණාත්මක මට්ටම් තීරණය කිරීම සඳහා විගණකවරයා විසින් සුදුසු පදනමක් භාවිතා කර නොතිබුණි.

4.4 විගණනයක් සැලසුම් කිරීම

විගණනයක් ඵලදායී ආකාරයෙන් සිදු කිරීම සඳහා විගණකවරයා විසින් විගණනය සැලසුම් කළ යුතුය. විගණනයක් සැලසුම් කිරීම යන්නට, ක්‍රියාවලිය සඳහා සමස්ත විගණන උපාය මාර්ගය ස්ථාපිත කිරීම සහ විගණන සැලැස්මක් සකස් කිරීම ඇතුළත් වේ.

කෙසේ වෙතත්, අවස්ථා කිහිපයකදී, සමස්ත විගණන උපාය මාර්ගය ස්ථාපිත කිරීමට සහ ඒ අනුව විගණන සැලැස්ම සකස් කිරීමට විගණකවරයා අසමත් වී තිබුණි.

4.5 විගණන සාක්ෂි

විගණකවරයාගේ මතය පදනම් කර ගැනීමට සාධාරණ නිගමනවලට එළඹීමට හැකි වන පරිදි ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට විගණකවරයාට හැකි වන පරිදි විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම විගණකවරයා විසින් සිදුකළ යුතුය.

ප්‍රධාන සොයාගැනීම් වල සාරාංශය

- හානිකරණ දර්ශක පවතින විට ලැබිය යුතු ණය ශේෂයේ ආපසු අයකර ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා විගණන ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක නොකිරීම.

- ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා විකුණුම් පිරිවැයට අදාළ කිසිදු ප්‍රමාණවත් විගණන ක්‍රියා පටිපාටියක් සිදු නොකිරීම.

- ජීවිත රක්ෂණ සමාගමක ආදායම, වෙළඳ ලැබිය යුතු මුදල් සහ මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට විගණකවරයා අසමත් වීම.

- වෙළඳ ණය ගැතියන්ගේ ආයතනයේ හානිකරණ තක්සේරුවේ සාධාරණත්වය පරීක්ෂා නොකිරීම.

4.6 අඛණ්ඩ පැවැත්ම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම කළමනාකරණය විසින් භාවිතා කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සහ නිගමනය කිරීම විගණකවරයා විසින් සිදුකළ යුතු වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම භාවිතා කිරීම පිළිබඳ ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු දැනුම් දෙන ලදී.

එක් අවස්ථාවක, අපි පහත සඳහන් දෑ නිරීක්ෂණය කළෙමු.

- අඛණ්ඩ පැවැත්මක් සහිතව ඉදිරියට යාමට ආයතනයට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් සහ තත්ත්වයන් පවතින විට අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක නොකිරීම

- මූල්‍ය ආධාර සැපයීම සඳහා මව් සමාගමේ තහවුරු කිරීම මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය භාවිතා කිරීම සුදුසු බව අනුබද්ධ ආයතනයක් නිගමනය කර ඇති විට, මූල්‍ය ආධාර සැපයීමට මව් සමාගමට ඇති හැකියාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා නොගැනීම.

- අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා මූල්‍ය පුරෝකථන සකස් කිරීමේදී භාවිතා කරන දත්තවල විශ්වසනීයත්වය සහ සුවිශේෂී උපකල්පනයන් ඇගයීමට ලක් නොකිරීම.

- දත්තවල විශ්වසනීයත්වය ඇගයීමට ලක් නොකිරීම සහ මූල්‍ය පුරෝකථන සකස් කිරීමේදී භාවිතා කරන මූලික උපකල්පනයන් භාවිතා කිරීමේ යෝග්‍යතාවය තක්සේරු නොකිරීම.

- කළමනාකරණයේ සැලසුම් සහ එම සැලසුම් වල ශක්‍යතාවය සම්බන්ධයෙන් කළමනාකරණ නියෝජනයක් ලබා නොගැනීම.

- තවත් අවස්ථාවක, ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයන් පවතින විට, විගණකවරයා විසින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මත සකස් කිරීමේ යෝග්‍යතාවය

2021 තුළදී විගණන පරීක්ෂණ

පිළිබඳව අවධානය යොමු කිරීම සම්බන්ධයෙන් නිගමනය කර නොතිබුණි.

4.7 විගණන නියැදීම

විගණක විසින් විගණන නියැදි භාවිතා කිරීමට තීරණය කර ඇති විට, ඔහු විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය SLAuS 530 - විගණන නියැදියට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ. ප්‍රධාන සොයාගැනීම් වලට පහත දෑ ඇතුළත් විය.

- අවස්ථා කිහිපයකදී සුදුසු නියැදි ක්‍රමවේදයක් භාවිතා කර නොතිබුණි.
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට රටේ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පැනවීමේ කටයුතු සඳහා සහය වීමට වාර්ෂික ප්‍රදානයක් ප්‍රතිපාදනය කිරීම මඟින්, මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ ඇතිකරගෙන ඇති අතීත වැඩපිලිවෙල අනුව, රුපියල් මිලියන 4ක ප්‍රධානයක් සැපයීම 2020 වර්ෂය තුළද දී ද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම අඛණ්ඩව කරගෙන ගියේය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් අනුගමනය කිරීම ඇතුළුව එවැනි ප්‍රකාශයන් සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම සහ අදාළ ලෙස ගැසට් පත්‍රයේ පලකිරීම වැනි ඇතැම් ක්‍රියායාරකම්වලට ඇතුළත් වේ. ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති කාරක සභා රැස්වීම් මසකට වරක් පවත්වනු ලබන අතර එම රැස්වීම්වලදී නව ප්‍රමිතීන් සම්මත කිරීම සහ පවතින ප්‍රමිතීන් සංශෝධනය කිරීම පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රමිති කමිටුව සහ විගණන ප්‍රමිති කමිටුව සඳහා තාක්ෂණික ප්‍රකාශයන් පිළිබඳ මහජනතාවට ප්‍රවේශය ලබා දීම සඳහා වෙන් වූ වෙබ් අඩවියක් ලබා දී ඇති අතර, අදාළ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන්හි සංවර්ධනයන් පිළිබඳ දැනුවත් කිරීමේ පහසුකම් ද ලබා දී ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති හා සම්බන්ධයෙන් වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ:

අ) ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (IASB) විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) මත පදනම් වූ සියලුම නවතම ප්‍රමිතීන් ඇතුළත් වන 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සංග්‍රහය නිකුත් කිරීම සහ පූර්ව සංග්‍රහයේ සිදුකරන ලද වෙනස්වීම් ගැසට් පත්‍රයේ පලකිරීම.

ආ) අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (IASB) විසින් නිකුත් කරන ලද පහත දැක්වෙන නිරාවරණ කෙටුම්පත් සහ සාකච්ඡාමය පත්‍රිකා සඳහා ප්‍රතිචාර දැක්වීම සහ විචාරාත්මකව සාකච්ඡා කිරීම.

- ED/2020/4 විකිණීමේ සහ කල්බදු වගකීම් (IFRS 16 යෝජිත සංශෝධනය)
- නිරාවරණ කෙටුම්පත් පිළිබඳ අදහස් - ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත තිරසාර ප්‍රමිතීන් සැකසීම සඳහා ජාත්‍යන්තර තිරසාර ප්‍රමිති මණ්ඩලයකට ඉඩ සැලසීම පිණිස ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත පදනමේ ව්‍යවස්ථාවට යෝජිත ඉලක්කගත සංශෝධන
- ED/2021/4 - හුවමාරු කිරීමේ හැකියාව නොමැතිකම

ඇ) ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිත මණ්ඩලය විසින් නිකුත් කරන ලද පහත සඳහන් ප්‍රකාශයන් අනුගමනය කිරීම

- SLFRS 9, LKAS 39, සහ SLFRS 7, පොලී අනුපාත මිණුම් ලකුණ ප්‍රතිසංස්කරණය - අදියර 1
- SLFRS 9, LKAS 39 සහ SLFRS 7, SLFRS 4, SLFRS 16 සඳහා සංශෝධන - පොලී අනුපාත මිණුම් දණ්ඩ ප්‍රතිසංස්කරණය - අදියර 2
- SLFRS 16 හි සංශෝධන - දේපල, පිරියත සහ උපකරණ - අපේක්ෂිත භාවිතයට පෙර ලැබෙන ආදායම
- LKAS වෙත සංශෝධන 37- භාරදූර ගිවිසුම් - කොන්ත්‍රාත්තුවක් ඉටු කිරීමේ පිරිවැය
- SLFRS 3 හි සංශෝධන - සංකල්පීය රාමුව වෙත යොමුව
- SLFRS 17 හි සංශෝධන - රක්ෂණ ගිවිසුම්
- SLFRS 16 සංශෝධනය - 2021 ජූනි 30 න් ඔබ්බට Covid-19 ආශ්‍රිත කුලී සහන
- SLFRS ප්‍රමිති 2018-2020 සඳහා වාර්ෂික වැඩිදියුණු කිරීම්

ඈ) පහත දැක්වෙන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ අර්ථකථන කමිටුවේ නඩු තීරණ වල නිකුතුව

- නඩු තීරණ සම්පාදනය - සංග්‍රහය 3 ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ අර්ථකථන කමිටුව විසින් අප්‍රේල් 2020-සැප්තැම්බර් 2020 ප්‍රකාශයට පත් කරන ලදී.
- නඩු තීරණ සම්පාදනය කිරීම - 4 වන වෙළුම ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ අර්ථකථන කමිටුව විසින් ඔක්තෝබර් 2020 මාර්තු 2021 ප්‍රකාශයට පත් කරන ලදී.

ඉ) පහත මාර්ගෝපදේශ නිකුත් කිරීම

- SLFRS 9 ට අනුකූලව අපේක්ෂිත ණය පාඩු තක්සේරු කිරීම සඳහා ඉහළ අවදානම් සහිත කර්මාන්ත හඳුනාගැනීම සඳහා මාර්ගෝපදේශ
- SLFRS 12 හි වත්මන් බදු සහ විලම්බිත බද්ද මැනීමේදී බදු අනුපාත අනුගමනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය

උ) බැංකුකරණය සහ රක්ෂණය වැනි විවිධ කර්මාන්ත ආවරණය වන පාර්ශ්වකරුවන්ගේ කණ්ඩායම් විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති ක්‍රියාවට නැංවීමේ සහ අර්ථ නිරූපණය කිරීමේ දී

2021 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සිදුකරන ලද ප්‍රමිත සකස් කිරීම හා බැඳුනු ක්‍රියාකාරකම්

පැනනගින ගැටළු පිළිබඳව අබණ්ඩව සාකච්ඡා කිරීම.

ඌ) සරල සහ සංකීර්ණ ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය සඳහා නිදර්ශන උදාහරණ නිකුත් කිරීම - ශ්‍රී.ලං.විග.ප්‍ර. 540 (සංශෝධිත)

එ) දුරස්ථ විගණන අභියෝග සහ විසඳුම් (පශ්චාත් - COVID 19) පිළිබඳ වෙබිනාර් වැඩසටහනක් පවත්වන ලදී.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } පීපීඩී/බී/එස්වල්ඒඒඑස්එම්බී/1/21/40 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 සැප්තැම්බර් 08

සභාපති
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශණය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකිවූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත්, නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේනම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්

කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අඃ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (අඃ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 පහත සඳහන් නිරීක්ෂණය හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උෟ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මණ්ඩලය විසින් රු. 5,086,000 ක මුදලක් වැය කරමින් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති අතර, විස්තරාත්මක මෘදුකාංග තාක්ෂණික ලියකියවිලි (DSTD), පරීක්ෂණ සැලැස්ම සකස් කිරීම, පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) නිර්ණායක ලේඛනය සකස් කිරීම සහ යෙදුම් මූලාකෘතිය සඳහා අනුමැතිය ලබාදීම ආදිය පමණක් සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත්, පද්ධතියේ ක්‍රියාකාරිත්වයේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන්, එය 2022 අගෝස්තු මාසය අවසන් වන තුරුත් කාර්යය සමාලෝචනය කිරීමේ අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කළ නොහැකි විය.

2.3 වෙනත් කරුණු

2021 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩු 16 ක් පැවතුණි. සම්පූර්ණ පුරප්පාඩු අතරින් පුරප්පාඩු 12ක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්ට බලපාන විධායක මට්ටමේ තනතුරු සම්බන්ධයෙන් විය. එසේම, සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාව 2022 අගෝස්තු දක්වාම ලැබී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2021 විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය

2022 සැප්. 08 දිනැති විගණන වාර්තාවේ දැක්වෙන නිරීක්ෂණ	කළමනාකරණයේ ප්‍රතිචාර
වගන්තිය 2.2.4 මණ්ඩලය විසින් කළමනාකරණ තොරතුරු පද්ධතිය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රුපියල් 5,086,000 ක් වැයකර තිබූ නමුත් සවිස්තරාත්මක මෘදුකාංග තාක්ෂණික ලියකියවිලි, පරීක්ෂණ සැලැස්ම සකස් කිරීම, පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ නිර්ණායක ලේඛන සකස් කිරීම සහ අයදුම්පත් මූලාකෘතිය සඳහා අත්සන් කිරීම වැනි කාර්යයන් පමණක් සම්පූර්ණ කර තිබුණි. කෙසේවෙතත් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් එය අපේක්ෂිත අරමුණ වූ සමාලෝචනය කිරීමේ කාර්යය සඳහා 2022 අගෝස්තු අවසානය දක්වා භාවිතා කළ නොහැකි වී තිබුණි.	ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය කර 2021 ඔක්තෝම්බර් මාසයේදී මෘදුකාංග සංවර්ධක වෙත ව්‍යාපෘතිය ප්‍රදානය කරන ලදී. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම හි මෙහෙයුම් ක්‍රියාවලියේ සුවිශේෂත්වය සැලකිල්ලට ගනිමින් (තොරතුරු තාක්ෂණ සංවර්ධකයින්ට හුරුපුරුදු සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුමක් මෙන් නොවූ), සවිස්තරාත්මක මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර (DSRS) සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ අදියර සම්පූර්ණ කිරීම සඳහා බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් ගත විය. මෘදුකාංග සංවර්ධකයා විසින් සකස් කරන ලද සවිස්තරාත්මක මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර සහ පද්ධති මූලාකෘති ද සවිස්තරාත්මක දීර්ඝ වාර්තා වන අතර, ඒවා අදාළ සියලු පාර්ශ්වයන් විසින් ඉතා අවධානයෙන් සමාලෝචනය කර සාකච්ඡා කළ යුතු වූ අතර පසුව එම වාර්තා අත්සන් කිරීමට සුදුසු සහ පිළිගත හැකි වාර්තා බවට පත්වන තෙක් සංශෝධනය කරන ලදී. ඒ අනුව සවිස්තරාත්මක මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර ඉදිරිපත් කිරීමෙහි ඉහත සඳහන් ප්‍රමාදය හේතුවෙන් සවිස්තරාත්මක මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර ඉදිරිපත් කිරීමෙන් පසුව සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්වල සිදුවූ ප්‍රමාදයන් නොවැළැක්විය හැකි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2022 ජූනි දක්වා ව්‍යාපෘතියේ කාල සටහන වෙනස් විය. මෙම ව්‍යාපෘතියේ උපදේශක වන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA), ඔවුන්ගේ LGC 2.0 (ලංකා රජයේ ක්ලවුඩ්) තුළ පද්ධතිය සඳහා නොමිලේ අවකාශය ලබා දීමට එකඟ වූ අතර, පසුව, LGC 2.0 හි සම්පත් භාවිතය උපරිම මට්ටමට පැමිණීම හා ඔවුන්ගේ සම්පත් පුළුල් කිරීමට ඔවුන්ට හැකියාවක් නොතිබීම හේතුවෙන් දැනට ක්‍රියාත්මක වන කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා සත්කාරකත්ව පහසුකම ලබා දීමට ඔවුන්ට හැකියාවක් නොමැති බව පිළිබඳව දැනුම් දෙන ලදී. තවද අයවැය සීමා හේතුවෙන්, පද්ධතිය අවසන් වෙමින් පවතින බැවින් සහ ක්ලවුඩ් පහසුකම කඩිනමින් අවශ්‍ය වූ බැවින්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම මේ සම්බන්ධයෙන් ICTA සමඟ නිරන්තරයෙන් පසු විපරම් කරමින් සිටි අතර, මේ සඳහා පුද්ගලික අංශය පාදක සේවා සපයන්නන් සොයන ලදී. තවද මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගැනීමද සිදුකරන ලදී. කෙසේ වෙතත්, මාස 3කට පසු ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය LGC 2.0 අවකාශ ලබා දීමට එකඟ විය. මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය යළි සැළසුම් කළ කාලරාමුවෙන් ඔබ්බට ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉහත සඳහන් කළ පරිදි ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ සහ සංවර්ධකයාගේ පාලනයෙන් ඔබ්බට ගිය කරුණාක් වූ මෙම පද්ධතියේ සත්කාරකත්වය පරීක්ෂා කිරීමට ඇති නොහැකියාවයි. කෙසේ වෙතත්, සර්වරයක් නොතිබියදී වුවත්, මෘදුකාංග සංවර්ධක විසින් 2022 අගෝස්තු මාසය තුළ සියලුම ප්‍රධාන නොවන මොඩියුලවල පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) ඔවුන්ගේම සර්වර මගින් පවත්වා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රධාන නොවන පද්ධති සංවර්ධන ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇත. ගෙවන ලද රු. 5,086,000/- ක මුදල, ගෙවීම් සැලැස්මේ පළමු වාරිකය සහ ICTA වෙත ගෙවන ලද උපදේශන ගාස්තුව හා සම්බන්ධ වේ. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම විසින් මෙම ගෙවීම් කොන්ත්‍රාත්තුවේ දක්වා ඇති පරිදි විශේෂිත අදියරකට අදාළ සියලුම කටයුතු අවසන් වූ පසු මෘදුකාංග සංවර්ධක වෙත නිකුත් කරන ලදී. තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව, විගණන කමිටුව සහ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රගතිය සම්බන්ධව සමීපව පසු විපරම් කරන ලද අතර ගුණාත්මක භාවයට හානියක් නොවන පරිදි සංශෝධිත සැලැස්මට අනුව ව්‍යාපෘතිය නිම කිරීම සහතික කිරීමට සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

2021 විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය

2022 සැප්. 08 දිනැති විගණන වාර්තාවේ දක්වෙන නිරීක්ෂණ	කළමනාකරණයේ ප්‍රතිචාර
වගන්තිය 2.3 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ තිබූ පුරප්පාඩු සංඛ්‍යාව 16කි. සම්පූර්ණ පුරප්පාඩු අතරින් පුරප්පාඩු 12ක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්ට බලපාන විධායක මට්ටමේ තනතුරු සඳහා විය. සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) එකඟතාව 2022 අගෝස්තු දක්වා ම ලැබී නොතිබින.	දීර්ඝ කාලයක් පැවති පුරප්පාඩු පිරවීම සඳහා තාක්ෂණික වශයෙන් දක්ෂ වරලත් ගණකාධිකාරීවරුන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය වෙත හැකි වන පරිදි වැටුප් පරිමාණයක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමෙන්තුවේ (MSD) එකඟතාවය මත බඳවා ගැනීමේ පටිපාටි අනුගමනය කරන ලෙස අමාත්‍ය මණ්ඩල තීරණයෙන් නියම විය. කෙසේ වෙතත්, බොහෝ පසු විපරම් කරනු ලැබූවද, සංශෝධිත බඳවාගැනීමේ පටිපාටි සඳහා MSD එකඟතාවය මෙතෙක් නොලැබුණ අතර එමඟින් අමාත්‍ය මණ්ඩල අනුමත වැටුප් ව්‍යුහය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස දැනට පවතින පුරප්පාඩු පිරවීමට මෙන්ම එහි කාර්ය මණ්ඩලය රඳවා ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට නොහැකි වී ඇත. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම ට වෘත්තීය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට / රඳවා ගැනීමට ඇති නොහැකියාව නියාමන ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇති අතරශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම දැනට කාර්ය සාධනයේ ද පිරිහීමේ ප්‍රවණතාවකට මුහුණ දී සිටී. (වරලත් ගණකාධිකාරීවරුන් 21 දෙනෙකුගෙන් සමන්විත මුළු අනුමත සේවක සංඛ්‍යාවෙන් ආයතනයේ ප්‍රධාන කටයුතු සිදු කිරීම සඳහා දැනට සේවයේ සිටින්නේ වරලත් ගණකාධිකාරීවරුන් 9 දෙනෙකු පමණි).

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දිනට	සටහන	31-දෙසැ-21 රු.	31-දෙසැ-20 රු. නැවත ප්‍රකාශ කිරීම
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	3	34,850,298	37,023,731
අස්පෘශ්‍ය වත්කම්	4	5,086,000	-
තැන්පතු	5	6,979,736	6,979,736
නිශ්චිත ප්‍රතිලාභ වත්කම	10	2,422,346	-
		49,338,380	44,003,467
ජංගම වත්කම්			
තොග	6	774,637	783,811
ලැබිය යුතු දෑ	7	2,466,515	3,651,614
මුදල් සහ මුදල් හා සමාන දෑ	8	13,452,909	8,468,634
		16,694,061	12,904,059
මුළු වත්කම්		66,032,441	56,907,526
වගකීම්			
ජංගම නොවන වගකීම්			
විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන	9	49,338,380	41,317,019
නිශ්චිත ප්‍රතිලාභ වගකීම්	10	-	2,686,448
		49,338,380	44,003,467
ජංගම වගකීම්			
විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන	11	13,304,506	9,644,531
ගෙවිය යුතු දෑ	12	3,389,555	3,259,528
		16,694,061	12,904,059
මුළු වගකීම්		66,032,441	56,907,526

56 වන පිටුවේ සිට 62 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ වගකීමකි.

මෙම මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

සභාපති

සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(මූල්‍ය හා පරිපාලන)

දිනය - 2022 පෙබරවාරි 22

මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	31-දෙසැ-21 රු.	31-දෙසැ-20 රු. නැවත ප්‍රකාශ කිරීම
ආදායම			
රාජ්‍ය ප්‍රදාන	13	75,236,691	71,467,943
අඩුකලා: ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිදහස්කල ප්‍රදාන		4,000,000	4,000,000
		71,236,691	67,467,943
මෙහෙයුම් වියදම්			
මණ්ඩලයේ සාමාජිකයන්ගේ දීමනා		(1,579,500)	(1,252,500)
විගණකවරුන්ගේ පාරිශ්‍රමික	14	(214,000)	(240,100)
කාර්ය මණ්ඩල පිරිවැය	15	(35,496,277)	(36,922,897)
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය		(1,568,191)	(1,656,830)
පුවත්පත් නිවේදන		(600,210)	(256,311)
කුලී හා ගොඩනැගිලි සේවා ගාස්තු		(11,529,825)	(10,061,219)
ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	3	(5,513,082)	(5,386,975)
විදුලිය		(871,114)	(939,094)
සමාලෝචකයින් සඳහා වූ වෘත්තීය ගාස්තු		(503,500)	(1,663,000)
අන්තර්ජාතික සාමාජිකත්වයන්		(1,954,819)	(2,420,339)
පොත් හා වාර සඟරා		(1,201,016)	(1,059,394)
ජාත්‍යන්තර ගමන්		-	(31,150)
පුහුණුව හා සංවර්ධනය		(2,818,139)	(183,275)
බලපත්‍ර හා රක්ෂණ		(934,425)	(998,698)
ලිපි ද්‍රව්‍ය		(797,473)	(687,779)
වෙනත් පරිපාලන වියදම්	16	(5,655,120)	(3,708,382)
වෙනත් විස්තීර්ණ අදායම්			
නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් වූ ලාභය / (පාඩුව)		3,234,677	(1,674,720)
නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමට අදාල රජයේ ප්‍රදාන		(3,234,677)	1,674,720
වර්ෂයේ ශුද්ධ අතිරික්ත/(හිඟය)		-	-

56 වන පිටුවේ සිට 62 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

	සමුච්චිත අරමුදල රු.
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	-
වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය)	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	-
වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය)	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**

56 වන පිටුවේ සිට 62 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	31-දෙසැ-21 රු.	31-දෙසැ-20 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය)		-	-
ගැලපීම්;			
වර්ෂය තුළ ලද රාජ්‍ය ප්‍රදාන		83,683,350	76,935,470
මුළු විස්තීර්ණ ආදායම්වලට මාරුකල විලම්භිත රාජ්‍ය ප්‍රදාන	13	(72,002,014)	(73,142,663)
ක්ෂය වීම්	3	5,513,082	5,386,975
කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය		1	14
පාරිතෝෂික අරමුදල් ආයෝජනයෙන් ලද පොළිය		(289,923)	(307,160)
නිශ්චිත ප්‍රතිලාභ වගකීම්	15.1	(2,033,794)	2,648,142
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර		14,870,702	11,520,778
වියදමට වැඩි ආදායම/ (ආදායම ට වැඩි ආදායම)			
තොග (වැඩිවීම)/ අඩුවීම		9,174	(141,001)
ලැබිය යුතු මුදල් (වැඩිවීම)/ අඩුවීම		(184,200)	247,479
ගෙවිය යුතු මුදල් වැඩිවීම/ (අඩුවීම)		130,027	(1,488,336)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		14,825,703	10,138,920
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම		(1,970,351)	(1,105,471)
මෘදුකාංග සංවර්ධනය සඳහා කරන ලද ගෙවීම්		(5,086,000)	-
පාරිතෝෂික අරමුදල් ආයෝජනය		(3,075,000)	(2,000,000)
පාරිතෝෂික අරමුදල්/ආරක්ෂිත සේප්පුව සම්බන්ධ ආයෝජන වලින් ලද පොළිය		289,923	307,160
ශුද්ධ මුදල් ප්‍රවාහ		4,984,275	7,340,609
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ		-	-
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		4,984,275	7,340,609
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		8,468,634	1,128,025
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ	8	13,452,909	8,468,634

56 වන පිටුවේ සිට 62 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

1. ආයතනික තොරතුරු

ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 22 දින එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයක් මගින් නිකුත් කිරීමට අවසර දෙන ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

මණ්ඩලයේ කාර්යය වන්නේ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ විධිවිධාන යටතේ නිශ්චිත ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, ඉදිරිපත් කිරීම සහ විගණනය කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල වීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමයි.

මණ්ඩලය 2021 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයන් 13ක් කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 3ක් සහ එක් සේවකයකු තාවකාලික පදනමින් සේවයේ යොදවා ඇත. (2020 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයින් 14ක් කොන්ත්‍රාත් පදනම මත 3ක් සහ එක් තාවකාලික සේවකයෙක් සේවයේ යොදවා තිබුණි).

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

පිළියෙළ කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම මත ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මත සකස්කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති කාල සීමාව පුරාවට අඛණ්ඩව යොදාගෙන ඇත.

වාර්තා කිරීමේ දිනට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දිනට පසුව සිදුවන සියලුම වැදගත් සිදුවීම් සලකා බලනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ

දේපල, පිරියත සහ උපකරණ පිරිවැය අඩුකළ සමුච්චිත ක්ෂයට දක්වනු ලැබේ. ක්ෂයවීම මූල්‍ය ප්‍රකාශන තුළ දක්වනු ලැබේ.

සරල මාර්ග පදනම මත, වත්කම්වල ඇස්තමේන්තුගත පලදායී ආයුකාලය අනුව කාර්යසාධනය පහත පරිදි වේ.

විස්තරය	ඇස්තමේන්තුගත පලදායී ආයුකාලය
මෝටර් වාහන	අවුරුදු 15 යි
කාර්යාලය උපකරණ	අවුරුදු 4-25
ගෘහ භාණ්ඩ, සවිකෘත සහ උපාංග	අවුරුදු 6-25
පොත් හා ප්‍රකාශන	අවුරුදු 3 යි

භාවිතා කරන කාල සීමාව මත පදනම්ව මිලදී ගත් වර්ෂයේ සහ විකුණුම් වර්ෂයේ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ. මිලදී ගත් මාසයේ සම්පූර්ණ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර විකුණුම් මාසයේ කිසිදු ක්ෂයවීමක් සිදුකරනු නොලැබේ.

පිරිවැය රු.7,500/- නොඉක්මවන මිළකට මිලදී ගත් පොත් සහ ප්‍රකාශන හැර අනෙකුත් අයිතම, පිරිවැය රු.1000 නොඉක්මවන සියලුම ගිණුම් ප්‍රමිති සහ විගණන ප්‍රමිති සහ අනෙකුත් ප්‍රකාශන මිලදී ගත් වර්ෂයේ වියදම් ලෙස දක්වනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් ආයතනයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ආ හැකි නම් සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් SLPSAS 20 අස්පෘශ්‍ය වත්කම්වලට අනුකූලව වත්කම්වල පිරිවැය විශ්වසනීයව මැනිය හැකි නම් හඳුනාගනු ලැබේ. සීමිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් පිරිවැය අඩුකළ සමුච්චිත ක්‍රමක්ෂ සහ සමුච්චිත හානි පාඩු වලට අනුව මණිනු ලැබේ.

ගබඩා භාණ්ඩ

ගබඩා භාණ්ඩ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් අතරින් අඩු වටිනාකමට අගය කරනු ලැබේ. ගබඩා භාණ්ඩවල පිරිවැය පළමු-ගැනුම්, පළමු-නිකුතු (FIFO) පදනම භාවිතා කිරීමෙනි මණ්නු ලැබේ.

ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් උපලබ්ධි වීමට ඇස්තමේන්තු කර ඇති මුදල් ප්‍රමාණයට දක්වා ඇති අතර, අවශ්‍ය අවස්ථාවලදී, බොල් සහ අඩමාණ ණය සඳහා මුල්‍ය ප්‍රකාශනවල දීමනාවක් වෙන්කරනු ලැබේ.

මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් සහ බැංකු වල සහ කෙටි කාලීන තැන්පතු පිරිවැයට ගණනය කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ අතේ ඇති මුදල් සහ තැන්පතු , ශුද්ධ හිගහිටි බැංකු අයිරාවලින් සමන්විත වේ.

ගෙවිය යුතු ගිණුම්

ගෙවිය යුතු ගිණුම් සඳහා වන වගකීම් ගෙවීමට අපේක්ෂිත මුදල් හා සමාන මුදල් ප්‍රමාණය අනුව ගණනය කෙරේ.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2. වැදගත් ගිණුම්කරණය ප්‍රතිපත්ති

නිශ්චිත ප්‍රතිලාභ පිරිවැය

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන නිශ්චිත ප්‍රතිලාභ බැඳීම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර, නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම නියෝජනය කරයි. මූල්‍ය කාර්ය සාධනය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ සියලුම ආයුගණක ලාභ සහ අලාභ වහා හඳුනා ගැනේ.

රජයේ ප්‍රදාන

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදාන, අදාළ වියදම් හඳුනාගෙන ඇති කාල සීමාව තුළ ආදායම ලෙස හඳුනාගනී.

පසු කාලීනව වියදම් කරනු ලබන වත්කම් අත්පත් කර ගැනීම සඳහා භාවිතා කරන රජයේ ප්‍රදාන විලම්බිත ආදායමක් ලෙස හඳුනාගැනේ. මුදල් සහ මුදල් සමාන දෑ ඇතුළු අනෙකුත් වත්කම් මගින් නියෝජනය වන රජයේ ප්‍රදාන, අඩු වගකීම් (ලැබෙන ප්‍රදාන නිසා ඇතිවන වගකීම් හැර) වගකීම් ලෙස හඳුනාගනී.

පූර්ව කාලපරිච්ඡේද දෝෂ

ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම සහ දෝෂ දැක්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් SLPSAS 3 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන නැවත දක්වා ඇත.

පසුගිය කාලය තුළ වාර්ෂිකව සමාලෝචනය නොකළ දේපල පිරියත සහ උපකරණ යටතේ ඇති මෝටර් රථ, කාර්යාලීය උපකරණ සහ ගෘහ භාණ්ඩ,සවිතෘත සහ උපාංග වැනි වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලයෙහි වෙනස්වීම් හේතුවෙන් පූර්ව කාල පරිච්ඡේද දෝෂ ගැලපීම් වලට භාජනය විය.

විලම්බිත ආදායම - රජයේ ප්‍රදානී ලෙස හඳුනාගෙන ඇති මුදල රජයේ ප්‍රදාන භාවිතයෙන් අත්පත් කරගත් වත්කම් (අඩු වගකීම්) නියෝජනය කරයි. පෙර කාලපරිච්ඡේද දෝෂවලට අදාළ ගැලපුම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනාගෙන ඇති මුදල් ප්‍රමාණය වැඩි වූ විට, අදාළ වත්කම මත විලම්බිත රජයේ ප්‍රදාන ද එම ප්‍රමාණයෙන් වැඩි වන අතර, එමඟින් විලම්බිත ආදායම- රජයේ ප්‍රදානඬ ලෙස හඳුනාගත් මුදල වැඩි වේ.

ඉහත ගැලපීම හේතුවෙන්, පෙර ප්‍රයෝජනවත් ආයු කාලය භාවිතා කරමින් වාර්තා වූ ක්ෂයවීම් රුපියල් 2,308,793 කින් වැඩි විය. මෙම වැඩිවීම හේතුවෙන් එම වර්ෂයේ වියදම් සඳහා යොදා ගන්නා ලද රජයේ ප්‍රදාන එම ප්‍රමාණයෙන් අඩු විය.

ඉහත වෙනස්වීම් හේතුවෙන් ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහයේ වෙනස්කම් සිදුවී නොමැත.

මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක තොරතුරු පහත පරිදි නැවත දක්වා ඇත.

	මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශණය		මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශණය	
	දේපල, පැළ හා උපකරණ	**කල් දැමූ ආදායම් රජයේ ප්‍රදාන (වත්මන් නොවන)**	**ක්ෂයවීම් වියදම් 2020**	**රජයේ ප්‍රදාන**
සටහන	**සටහන 3**	**සටහන 9**	**සටහන 3**	**සටහන 13**
	රු.	**රු.**	**රු.**	**රු.**
කලින් වාර්තා කළ	9,345,772	13,639,060	3,078,182	69,159,150
පූර්ව කාල පරිච්ඡේද ගැලපීම මත දෝෂ වල බලපෑම	29,986,752	29,986,752	-	-
ක්ෂයවීම් මත දෝෂ වල බලපෑම 2020 සඳහා වියදම්	(2,308,793)	(2,308,793)	2,308,793	2,308,793
2020.12.31 දිනට ශේෂය නිවැරදි කරන ලදී	**37,023,731**	**41,317,019**	**5,386,975**	**71,467,943**

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

3. දේපළ, පිරියත හා උපකරණ

	මෝටර් වාහන		කාර්යාල උපකරණ		ලී බඩු සහ සවිකිරීම්		පුස්තකාල පොත්		කෙරිගෙන යන වැඩ		එකතුව	
දිනට	**31-දෙසැ-21 රු.**	31-දෙසැ-20 රු.	**31-දෙසැ-21 රු.**	31-දෙසැ-20 රු.	**31-දෙසැ-21 රු.**	31-දෙසැ-20 රු.	**31-දෙසැ-21 රු.**	31-දෙසැ-20 රු.	**31-දෙසැ-21 රු.**	**31-දෙසැ-21 රු.**	31-දෙසැ-20 රු. නැවත ප්‍රකාශ කරන ලදී
පිරිවැය												
වර්ෂය ආරම්භයේ ශේෂය	**51,160,000**	51,160,000	**11,456,057**	12,400,701	**12,217,271**	11,420,413	**3,198,399**	3,198,399	**-**	**78,031,727**	78,179,513
එකතු කිරීම්	**-**	-	**1,191,480**	308,613	**185,266**	796,858	**25,000**	-	**568,605**	**1,970,351**	1,105,471
ඉවත් කිරීම්	**-**	-	**(395,000)**	(1,253,257)	**-**	-	**-**	-	**-**	**(395,000)**	(1,253,257)
	-	-	**-**	-	**-**	-	**-**	-	**1,369,299**	**1,369,299**	-
සමුච්චිත ක්ෂය ශේෂය	**51,160,000**	51,160,000	**12,252,537**	11,456,057	**12,402,537**	12,217,271	**3,223,399**	3,198,399	**1,937,904**	**80,976,377**	78,031,727
සමුච්චිත ක්ෂය ශේෂය												
වර්ෂය ආරම්භයේ ශේෂය	**21,278,666**	17,868,000	**7,437,400**	7,439,430	**9,094,004**	8,369,988	**3,197,926**	3,196,846	**-**	**41,007,996**	36,874,264
වර්ෂය සඳහා ක්ෂයවීම්	**3,410,667**	3,410,666	**1,353,624**	1,251,213	**741,153**	724,016	**7,638**	1,080	**-**	**5,513,082**	5,386,975
ඉවත් කිරීම් මත ක්ෂයවීම්	**-**	-	**(394,999)**	(1,253,243)	**-**	-	**-**	-	**-**	**(394,999)**	(1,253,243)
	-	-	**-**	-	**-**	-	**-**	-	**-**	**-**	-
වර්ෂය අවසාන ශේෂය	**24,689,333**	21,278,666	**8,396,025**	7,437,400	**9,835,157**	9,094,004	**3,205,564**	3,197,926	**-**	**46,126,079**	41,007,996
වර්ෂය අවසාන ශේෂය ලියාඅඩුකළ අගය	**26,470,667**	29,881,334	**3,856,512**	4,018,657	**2,567,380**	3,123,267	**17,835**	473	**1,937,904**	**34,850,298**	37,023,731

ප්‍රාග්ධන වැඩකටයුතුවලට 2019 සහ 2021 කාලය තුළ කාර්යාල අවකාශයට අදාළව සිදු කරන ලද අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශක වෙත ගෙවන ගාස්තු ඇතුළත් වේ. රජයේ ප්‍රාග්ධන වියදම් කප්පාදු කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය කල් දමා ඇති අතර 2023 දී නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

	31-දෙසැ-21 රු.	31-දෙසැ-20 රු. නැවත ප්‍රකාශ කිරීම
4. අස්පෘශ්‍ය වත්කම් (මෘදුකාංග)		
මෘදුකාංග - කෙරීගෙන යන වැඩ	5,086,000	-

මෙය SLAASMB හි කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මෘදුකාංග සංවර්ධකයින්ට පළමු වාරිකය ගෙවීම සහ ව්‍යාපෘතියේ උපදේශකවරු වන ICTA (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (ICTA) වෙත ගෙවන අදාළ උපදේශන ගාස්තු වලින් සමන්විත වේ.

5. තැන්පතු (ජංගම නොවන)		
කුලී තැන්පතු	6,879,736	6,879,736
ආරක්ෂක සේප්පු තැන්පතු	100,000	100,000
	6,979,736	6,979,736
6. තොග		
ලිපි ද්‍රව්‍ය	774,637	783,811
7. ලැබිය යුතු දෑ		
ඉදිරියට කළ ගෙවීම්	2,461,515	2,252,315
කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර ඉදිකිරීම් සඳහා උපදේශකවරුන්ට කරල ලද කොටස් වශයෙන් ගෙවීම්	-	1,369,299
තැන්පතු	5,000	30,000
	2,466,515	3,651,614
8. මුදල් සහ මුදල් සමාන දෑ		
බැංකුවේ සහ අතැති මුදල්	13,452,909	8,468,634
	13,452,909	8,468,634
9. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රධාන (ජංගම නොවන)		
වර්ෂය ආරම්භයේ ශේෂය	41,317,019	46,246,679
ජංගම නොවන වත්කම් අත්පත් කරගැනීම සඳහා ලැබුණු හා වැයකල ප්‍රදාන	7,056,351	1,105,471
ලැබිය යුතු ගිණුම් වලින් මාරු කරන ලද ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීමට භාවිතා කරන ප්‍රදාන	1,369,299	-
පාරිතෝෂික අරමුදලෙහි ආයෝජනය කල ලැබුණු ප්‍රදාන	3,075,000	2,000,000
වර්ෂය සඳහා ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	(5,513,082)	(5,386,975)
පාරිතෝෂික අරමුදලෙන් ලැබූ පොළිය	289,923	307,160
කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය	(1)	(14)
නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වල වර්ෂය සඳහා වෙනස්වීම	1,743,871	(2,955,302)
වර්ෂය අවසානයේ ශේෂය	49,338,380	41,317,019
නියෝජනය වන්නේ		
දේපළ පිරියත හා උපකරණ	34,850,298	37,023,731
අස්පෘශ්‍ය වත්කම්	5,086,000	-
තැන්පතු (ජංගම නොවන)	6,979,736	6,979,736
(පාරිතෝෂික වෙන්කිරීම්)/ පාරිතෝෂික අරමුදලේ අතිරික්තය	2,422,346	(2,686,448)
වර්ෂය අවසානයේ ශේෂය	49,338,380	41,317,019

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

	31-දෙසැ-21 රු.	31-දෙසැ-20 රු. නැවත ප්‍රකාශ කිරීම
10. නිශ්චිත ප්‍රතිලාභ වගකීම් / වත්කම්		
වර්ෂය ආරම්භයේ ශේෂය	9,295,495	6,340,193
වර්ෂය තුළ ප්‍රතිපාදන	563,412	836,135
වර්ෂය තුළ ලැබුණු පොළිය	927,394	444,447
ආයුගණක ලාභ/පාඩු	(3,234,677)	1,674,720
	7,551,624	9,295,495
වර්ෂය තුළ ගෙවීම්	(677,380)	-
	6,874,244	9,295,495
පාරිතෝෂික අරමුදල (සටහන් 10.1)	(9,296,590)	(6,609,047)
වර්ෂය අවසානයේ ශේෂය	(2,422,346)	2,686,448
ප්‍රතිපාදනයේ වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී පහත සඳහන් උපකල්පන භාවිතා කර ඇත.		
අපේක්ෂිත වේතන වැඩිවීම	10%	10%
වට්ටම්/පොලී අනුපාතය	10.90%	7.01%
සේවක පිරිවැටුම් අනුපාතය	9%	9%
පාරිතෝෂික සඳහා වගකීම ආංශිකව බාහිර අරමුදල් මගින් සම්පාදනය වී ඇත.		
10.1 පාරිතෝෂික අරමුදල		
වර්ෂය ආරම්භයේ ශේෂය	6,609,047	4,301,887
වර්ෂය තුළ සිදුකරන ලද ආයෝජන	3,075,000	2,000,000
වර්ෂය තුළ ලැබුණු පොළිය	289,923	307,160
වර්ෂය තුළ කරන ලද ගෙවීම්	(677,380)	-
වර්ෂය අවසානයේ ශේෂය	9,296,590	6,609,047
11. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රධාන (ජංගම)		
වර්ෂය ආරම්භයේ ශේෂය	9,644,531	922,064
තොග සහ ලැබිය යුතු දෑ වල වැඩිවීම්/(අඩුවීම්)	(1,194,273)	(106,478)
මුදල් සහ මුදල් හා සමාන දෑ වල වැඩිවීම්/(අඩුවීම්)	4,984,275	7,340,609
විලම්බිත ආදායම් සහ ගෙවිය යුතු දෑ වල (වැඩිවීම්)/අඩුවීම්	(130,027)	1,488,336
වර්ෂය අවසානයේ ශේෂය	13,304,506	9,644,531
නියෝජනය වන්නේ		
තොග	774,637	783,811
ලැබිය යුතු දෑ	2,466,515	3,651,614
මුදල් සහ මුදල් හා සමාන දෑ	13,452,909	8,468,634
ගෙවිය යුතු දෑ	(3,389,555)	(3,259,528)
වර්ෂය අවසානයේ ශේෂය	13,304,506	9,644,531
12. ගෙවිය යුතු දෑ		
විගණකවරුන්ගේ පාරිශ්‍රමික	428,300	417,100
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ගෙවිය යුතු ප්‍රදාන	1,000,000	1,000,000
සමාලෝචකයින් සඳහා ගෙවිය යුතු වෘත්තීය ගාස්තු	154,500	300,000
ගෙවිය යුතු කාර්ය මණ්ඩල දිරි දීමනා	682,500	754,000
උපචිත අභ්‍යන්තර විගණන ගාස්තු	175,000	90,000
උපචිත වාර්ෂික වාර්තා වියදම්	550,000	376,730
වෙනත් ගෙවිය යුතු	399,255	321,698
	3,389,555	3,259,528

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	31-දෙසැ-21 රු.	31-දෙසැ-20 රු. නැවත ප්‍රකාශ කිරීම
13. රාජ්‍ය ප්‍රදාන		
වර්ෂය තුළ ලැබුණු රාජ්‍ය ප්‍රදාන	**83,683,350**	76,935,470
පාරිතෝෂික අරමුදල සඳහා ලැබුනු සහ අයෝජනය කළ ප්‍රදාන	**(3,075,000)**	(2,000,000)
ප්‍රාග්ධන වියදම් සඳහා යෙදූ ප්‍රදාන	**(7,056,351)**	(1,105,471)
ලැබිය යුතු ගිණුම් වලින් මාරු කරන ලද ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීමට භාවිතා කළ ප්‍රදාන	**(1,369,299)**	-
ශුද්ධ ජංගම වත්කම් සඳහා වැය කල ප්‍රදාන	**(3,659,975)**	(8,722,467)
වර්ෂය සඳහා ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්	**5,513,082**	5,386,975
පාරිතෝෂික අරමුදලින් ලැබූ පොළිය	**(289,923)**	(307,160)
කාර්යාලීය උපකරණ ඉවත් කිරීමේදී වූ අලාභය	**1**	14
වර්ෂය සඳහා නිශ්චිත ප්‍රතිලාභ වගකීම්	**1,490,806**	1,280,582
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන ප්‍රදාන	**75,236,691**	71,467,943
විස්තීර්ණ ආදායම් තුළ දැක්වෙන නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යළි ගණනය කිරීම සම්බන්ධ ප්‍රදාන	**(3,234,677)**	1,674,720
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පෙන්වා ඇති මුළු විස්තීරණ ආදායම් වලට මාරු කරල ලද මුලු ප්‍රදාන	**72,002,014**	73,142,663
14. විගණකවරුන්ගේ පාරිශ්‍රමික		
ජංගම වර්ෂයේ වියදම්	**240,100**	240,100
පසුගිය වසරේ (අධි)/ ඌන වෙන් කිරීම්	**(26,100)**	-
	214,000	240,100
15. කාර්ය මණ්ඩල පිරිවැය		
කාර්ය මණ්ඩල පාරිශ්‍රමික	**18,028,171**	19,258,631
සේවක අර්ථසාධක අරමුදල්	**2,279,064**	2,452,919
සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල්	**569,767**	613,230
නිශ්චිත ප්‍රතිලාභ වගකීම් (සටහන 15.1)	**1,200,883**	973,422
වෙනත් බාහිරින් ලබා ගත් සේවා සඳහා ගෙවීම්	**1,213,090**	727,607
කාර්ය මණ්ඩල දිරි දීමනා	**8,352,500**	9,048,000
වෛද්‍ය රක්ෂණය	**529,060**	517,434
කාර්ය මණ්ඩල ශුභසාධනය	**646,937**	672,446
වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	**2,676,805**	2,659,208
	35,496,277	36,922,897
15.1 නිශ්චිත ප්‍රතිලාභ වගකීම්		
වර්ෂය සඳහා ගාස්තු	**563,412**	836,135
වර්ෂය සඳහා ශුද්ධ පොළිය	**637,471**	137,287
	1,200,883	973,422
වෙනත් විස්තීර්ණ අදායම් ලෙස හෙළිදරව්කල ආයුෂණක ලාභ/අලාභ	**(3,234,677)**	1,674,720
මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි හෙලිදරව් කල නිශ්චිත ප්‍රතිලාභ වගකීම්	**(2,033,794)**	2,648,142

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	31-දෙසැ-21 රු.	31-දෙසැ-20 රු. නැවත ප්‍රකාශ කිරීම
16. වෙනත් පරිපාලන වියදම්		
වාර්ෂික වාර්තා	744,535	412,512
පරිගණක නඩත්තු වියදම්	191,883	160,558
උපකරණ නඩත්තු වියදම්	454,247	333,255
සන්නිවේදන වියදම්	1,129,872	831,077
වාහන නඩත්තු වියදම්	1,043,901	846,727
වාහන ගාල් කිරීමේ වියදම්	342,300	291,223
කාර්යාල වියදම්	457,556	265,660
ආපසු අයකළ නොහැකි තැන්පතු කපා හැරීම්	25,000	-
නෛතික හා වෘත්තීයවේදී ගාස්තු	379,576	112,800
අභ්‍යන්තර විගණන ගාස්තු	350,000	174,700
ගෘහ භාණ්ඩ සහ උපාංග සහ කාර්යාල උපකරණ රක්ෂණය	126,682	136,380
දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වියදම්	171,940	79,206
ගමන් වියදම්	188,140	40,665
විවිධ වියදම්	49,488	23,619
	5,655,120	3,708,382

17. ප්‍රාග්ධන බැඳීම්

17.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් 2021 දී මෘදුකාංග සංවර්ධකයින්ට අදාළ කොන්ත්‍රාත්තුව ලබා දෙමින් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIC) සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. තවද, කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතියේ උපදේශකයින් ලෙස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) පත් කර ඇත.

ඒ අනුව, 2021 දෙසැම්බර් 31 දිනවන විට ගිවිසුම්ගතව ඇති නමුත් කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ ව්‍යාපෘතිය සඳහා දරනු නොලැබූ ප්‍රාග්ධන බැඳීම රු. 37,764,000/- (2020 දෙසැම්බර් වන විට රු.2,670,000/-) වේ.

17.2 වර්ෂය තුළ කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ සහ උපාංග මිලදී ගැනීම සහ දුරකථන පද්ධතිය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් රුපියල් 620,656/- ක ප්‍රාග්ධන වියදම් බැඳීමක් සිදුව ඇති නමුත් 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන කිසිවක් සලසා නොතිබුණි. (2020 දෙසැම්බර් 31 දිනට කිසිදු බැඳීමක් නොමැත.)

18. අසම්භාව්‍ය වගකීම්

2021 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් නොතිබුණි. (2020 දෙසැම්බර් 31 දිනට - කිසිත් නොමැත)

19. මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දිනට පසු සිදුවීම්

වාර්තා කළ දිනට පසුව මූල්‍ය ප්‍රකාශනවල යම් ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන තරම් වැදගත්වන සිදුවීම් කිසිවක් නොතිබුණි.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්

පනත සහ පනත යටතේ ඇති නීතිරීති ප්‍රකාර පහත සඳහන් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස නිර්වචනය කර ඇත.

- බලපත්‍රලාභී බැංකු.
- රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා බලය පවරන ලද සමාගම්.
- කල් බදු ව්‍යාපාර කටයුතු වල නිරත වී සිටින සමාගම්.
- ණය විකතුකිරීමේ සමාගම්.
- මූල්‍ය සමාගම්.
- ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් ලෙස හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යෑමට බලය පැවරූ සමාගම්.
- වීකක භාර ක්‍රියාත්මක කිරීම සඳහා බලයලත් සමාගම්.
- අරමුදල් කලමනාකරණ සමාගම්.
- කොටස් හුවමාරුවක් ලෙස ක්‍රියාත්මකවීමට බලයලත් සමාගම්.
- කොටස් වෙලඳපලේ ලැයිස්තුගත සමාගම්.
- අනෙකුත් සමාගම්

  (අ) රුපියල් මිලියන 500 කට වැඩි පිරිවැටුමක් ඇති සමාගම්;

  (ආ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී කොටස් හිමියන්ගේ ස්කන්ධය රුපියල් මිලියන 100 කට අධිකව තිබූ සමාගම්;

  (ඇ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී දළ වත්කම් රුපියල් මිලියන 300 කට අධිකව තිබූ සමාගම්;

  (ඈ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී බැංකුවලට සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට රුපියල් මිලියන 100 කට වැඩි බැරකම් පැවති සමාගම්;

  (ඉ) කාර්ය මණ්ඩලයේ සේවකයින් සංඛ්‍යාව 1,000 කට අධික සමාගම්;

- භාණ්ඩ අලෙවියෙහි හෝ සේවා සැලසීමෙහි නියුක්ත රාජ්‍ය සංස්ථා.

- ඉහත සඳහන් වර්ග වලින් කවර හෝ වර්ගයකට වැටෙන වීක් සමාගමක් ඇතුළත් සමාගම් සමූහයක්. මෙම කාර්යය සඳහා සමාගම් සමූහය යන්නෙන්, සමාගම් පනත යටතේ ස්වකීය ගිණුම් වීකාබද්ධ කළ යුතු පාලක සමාගමක් හා එහි පාලිත සමාගම් අදහස් වේ.

ආයතනයේ නම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

නෛතික තත්වය

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත අනුව
සංස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

සංස්ථාපිත කරන ලද රට

ශ්‍රී ලංකාව

ප්‍රධාන කාර්යාලය

තෙවන මහල, 293, ගාලු පාර, කොළඹ 3
දුරකථන අංකය: 011 2301210 ෆැක්ස්: 011 2301211
විද්‍යුත් තැපෑල - slaasmb@sltnet.lk

වෙබ් අඩවිය

www.slaasmb.gov.lk

විගණකවරුන්

ව්‍යවස්ථාපිත විගණකවරුන්
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/2, පොල්දූව පාර,
බත්තරමුල්ල

අභ්‍යන්තර විගණකවරුන්

ප්‍රයිස් වෝටර් හවුස් කූපර්ස්
නො.100, බ්‍රේබෘක් මාවත,
කොළඹ 2

බැංකුකරු

ලංකා බැංකුව

නීති උපදේශකවරු

නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12